# බස්නාහිර පළාතේ පළාත් සභාව

மேல் மாகாண மாகாண சபை
WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2019** පෙබරවාරි **05** වන අඟහරුවාදා
2019 மாசி 05 செவ்வாய்க் கிழமை
Tuesday 05th February 2019

**බත්තරමුල්ල , ශ්‍රී ජයවර්ධනපුර , ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 204 (12 වන මහල) හි පිහිටි බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல ,ஸ்ரீ ஜயவர்த்தனபுர ,டென்சில் கொப்பேகடுவ மாவத்தை இலக்கம் 204(12 ஆம் மாடி) இல் அமைந்துள்ள மேல் மாகாண மாகாண சபையின் கட்டடத் தொகுதியின் கூட்ட மண்டபத்தில் நடைபெற்ற சபைக் கூட்டம்.

Council meeting was to be held at the Council Hall located in the 12th floor of Western Province Provincial Council at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.30 ට පළාත් සභාව රැස් විය.**
*மு.ப. 09.30 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.30 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදන
ANNOUNCEMENTS OF CHAIRMAN

*i*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"අතිගරු ජනාධිපතිතුමා විසින් 2019.01.04 දින සිට ක්‍රියාත්මක වන පරිදි බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාර ධුරයට පත් කරන ලද එම්. අසාද් එස්. සාලි මැතිතුමා, 2019.01.09 දින එම ධුරයේ රාජකාරි භාරගන්නා ලද බව, බස්නාහිර පළාතේ ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/14/5/3 හා 2019.01.21 දිනැති ලිපිය මගින් සභා ලේකම්තුමා වෙත දැනුම් දී තිබෙනවා. අභිනවයෙන් පත් වූ ගරු ආණ්ඩුකාරතුමා වෙත අපගේ සුභාශිංසන පිරිනමනවා."*

*ii*

*"2019.02.19 දින [අඟහරුවාදා දින] රජයේ නිවාඩු දිනයක් වන බැවින් හා 2019.02.18 දිනය අතිගරු ජනාධිපතිතුමා විසින් ගරු මන්ත්‍රීවරුන් වෙත කරන ලද කැඳවීමක් අනුව රැස්වීමක් යෙදී තිබීම හේතුකොටගෙන පසුගිය සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ නිර්දේශ අනුව මීළඟ පළාත් සභා රැස්වීම පැවැත්වෙන දිනය 2019.02.20 බදාදා දිනය ලෙස සලකා කටයුතු කිරීමට සිදු වී තිබෙනවා. ඒ අනුව සභාවේ රැස්වීම් සම්බන්ධ යෝජනාවක් අද දින සභා න්‍යාය පත්‍රයට ඇතුළත් කර තිබෙන බව ද මෙම අවස්ථාවේදී මම සභාවට දැනුම් දෙනවා.*

*න්‍යාය පත්‍රයේ සභාවේ රැස්වීම් යන විෂයයට පැමිණි විට ඒ සම්බන්ධව නිශ්චිත තීරණයක් ලබාදෙන මෙන් ගරු මන්ත්‍රීවරුන් වෙත මෙලෙස පූර්ව දැනුම් දීමක් කරනවා."*

*iii*

*"මෙම පළාත් සභාවේ ධුර කාලය තව මාස කිහිපයකින් අවසන් වීමට නියමිතව ඇති බැවින් හා ඒ හේතුකොටගෙන පෙත්සම් කාරක සභාවට පෙත්සම් විභාගයට ප්‍රමාණවත් කාලයක් නොලැබෙන බැවින්, 2019 පෙබරවාරි මාසය අවසන් වීමෙන් පසුව එළැඹෙන සභා රැස්වීම් දිනවලදී පළාත් සභාව වෙත පෙත්සම් ඉදිරිපත් නොකිරීමේ යෝග්‍යතාවය පිළිබඳව 2019.01.28 දින පැවති මහජන පෙත්සම් කාරක සභාවේදී සැලකිල්ලට ලක්වූ අතර, ඒ පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමක් කරන ලෙස ඉල්ලීමක්ද ඉදිරිපත් වී තිබෙනවා.*

*මේ සම්බන්ධයෙන් සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී සාකච්ඡා කර සුදුසු පියවරක් ගැනීමට බලාපොරොත්තුවන බව කාරුණිකව දැනුම් දෙන අතර, ඒ පිළිබඳව ගරු මන්ත්‍රීවරුන්ගේ යම් අදහස් හා යෝජනා ඇත්නම් ආණ්ඩු පක්ෂයේ හෝ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමන්ලා මගින් හෝ සෘජුවම මා වෙත හෝ සභා ලේකම්තුමා වෙත දැනුම් දෙන මෙන් කාරුණිකව දැනුම් දෙනවා.*

*මේ සම්බන්ධයෙන් හෙට දින එනම් 2019.02.06 දින පැවැත්වෙන සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී වැඩිදුරටත් සාකච්ඡා කර, සුදුසු පියවරක් ගැනීමට අදහස් කරන බව වැඩිදුරටත් සභාවට කාරුණිකව දැනුම් දෙනවා."*

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

ගරු සභාපතිතුමනි, මේ ටැබ් එකේ අද දින න්‍යාය පත්‍රය නැහැ. ඇයි දන්නේ නැහැ නේද? අපි මේකේ ප්‍රයෝජනය ගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, අද උදේටු ඒක ලැබිලා තිබෙන්නේ. ඒක තව ටිකකින් ඇතුළත් කරනවාලු. කොහොම හරි න්‍යාය පත්‍රය පරක්කු වෙලා ලැබිලා තිබෙන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මේක කලින්ම ඇවිත් කරලා තිබුණාම මන්ත්‍රීවරුන්ට, අපට හරි පහසුයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලේකම්තුමා ඔබතුමා ඒ ගැන කඩිනම්ව පියවරක් ගන්න. ගරු මහ ඇමතිතුමා න්‍යාය පත්‍රය ඇරෙන්න අනික් ඔක්කොම, හැන්සාඩ්, කාර්ය සටහන් සියල්ලම ඇතුළත් කරලා තිබෙනවාලු. අද න්‍යාය පත්‍රය නැතිවට කාර්ය සටහන් සහ හැන්සාඩ් වාර්තා සියල්ලම ඇතුළත් කරලා තිබෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

න්‍යාය පත්‍රයත් අවශ්‍යයි නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ පිළිබඳව ලේකම්තුමා පොඩ්ඩක් බලන්න. මමයි මේ පිළිබඳව අපහසුතාවයට පත් වෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් මා වෙත දිගින් දිගටම පැමිණිලා ලැබිලා තිබෙනවා, චෝදනා කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමන්ලාගේ භෝජනාගාරය වෙතට විශේෂ අමුත්තන් කැඳවනවා කියලා. භෝජනාගාරය ඇතුළට අරගෙන එනවා කියලා මට කිහිප අවස්ථාවකම චෝදනා කරලා තිබෙනවා. ඒ නිසා මම ඉතාමත් කාරුණිකව ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. ගරු මන්ත්‍රීතුමන්ලාගේ භෝජනාගාරයට පිටතින් අමුත්තන් අරගෙන එන්න එපා. ඕනෑම වෙලාවක නිලධාරීන්ගේ භෝජනාගාරයේ ආහාර ගන්න ඒ අයට අපි ඉඩ සලස්වා තිබෙනවා. කිසි ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. කවුරු එක්කන් ආවත් ඒ අයට අපි Token එකක් නිකුත් කරනවා, නිලධාරීන්ගේ භෝජනාගාරයේ ආහාර ගැනීම සඳහා. ඒ නිසා කරුණාකරලා ගරු මන්ත්‍රීතුමන්ලා, විශේෂයෙන් ගරු මන්ත්‍රීතුමියන්ලා භෝජනාගාරයට පිටතින් අමුත්තෝ අරගෙන එන්න එපා. ඒක මන්ත්‍රීවරුන්ට කරන ලොකු අගෞරවයක්.

# කාරක සභා වාර්තා පිළිගැන්වීම
PRESENTATION OF COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2019.01.23 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම ඔබතුමන්ලා වෙත පිළිගන්නවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*The Hon. Chairman declared that a copy of the relevant report is placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
PETITIONS

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, මොරොන්තුඩුව, මාරගහවත්ත, අංක 40 හි පදිංචි පී. සමන්ති රුදිගෝ යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. නුගේගොඩ, ගංගොඩවිල, රබර්වත්ත පාර, 2 වන පටුමග, අංක 25 හි පදිංචි ඊ. සඳනි ඉරේෂා අබේසේකර යන අයගේ පෙත්සම සහ
ii. කොළොන්නාව, සාලමුල්ල, ලක්සඳ සෙවණ, අංක 1A/FO/U11 හි පදිංචි කේ. මධූකා ක්‍රිෂානි ද සොයිසා යන අයගේ පෙත්සම.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

ගරු සභාපතිතුමනි, මොරටුව, පහළ ඉදිබැද්ද, අංක 35/5 හි පදිංචි කේ. චාන්දනී ෆොන්සේකා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ගරු සභාපතිතුමනි, අලුත්ගම, ගනේගම, ගාලුපාර, අංක 312/1 හි පදිංචි යූ. රංගන උක්වත්ත යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු පී. ආර්. පී. අබේගුණවර්ධන**
Hon. P. R. P. Abegunawardana

ගරු සභාපතිතුමනි, කළුතර දකුණ, හිල්වීදිය, අංක 87/13A හි පදිංචි ෆාරුක් මොහොමඩ් සුලෙයිමාන් සිරාජ් යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee*

## ප්‍රශ්න, පෙර සභාවේ අතුරු ප්‍රශ්න හා පිළිතුරු සැපයීම
QUESTIONS, INTERIM QUESTIONS OF PREVIOUS MEETING AND ANSWERS TO SUCH

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න හා අතුරු ප්‍රශ්න යටතේ පළමුවෙන්ම යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ගරු මාර්ග ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට නියමිත ප්‍රශ්නය ඉදිරිපත් කිරීමේ අවස්ථාව. දෙන්නාම සභා ගර්භයේ නැහැ. ගරු ඇමතිතුමාත් නැහැ. ප්‍රශ්නය ඉදිරිපත් කරපු විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාත් නැහැ. උත්තර මොනවත් ලැහැස්ති නැහැ නේද?

ඊළඟට මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් එම ප්‍රශ්නය ප්‍රවාහන, මහාමාර්ග ගරු ඇමතිතුමාට ඉදිරිපත් කිරීමේ අවස්ථාව.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, වැඩ බලන ඇමතිතුමාත් නැද්ද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙරිල් ගරු මන්ත්‍රීතුමා, කවුරුවත් නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ලලිත් වනිගරත්න ඇමතිතුමා රට ගියා නම් වැඩ බලන ඇමතිවරයෙක් ඉන්නවා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ ගැන මොකුත් මට දැනුවත් කරලා නැහැ. ගරු මහ ඇමැතිතුමා දැනුවත් වෙලාද දන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් මාව දැනුවත් වෙලා නැහැ. ලලිත් වනිගරත්න ඇමතිතුමා විදේශගත වෙලාද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, විදේශගත වෙලා නම් වැඩ බලන ඇමතිවරයෙක් ඉන්න ඕනෑ නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. වැඩ බලන ඇමතිවරයෙක් ඉන්න ඕනෑ. මම දන්නේ නැහැ. සභාවට වාර්තා කරලා නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එහෙම යන්න බැහැ නේ. වැඩ බලන ඇමතිවරයෙක් පත් නොකර.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඔබතුමාගේ -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා. ගරු සභාපතිතුමනි, මේකෙන් අපට ලොකු අසාධාරණයක් වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. අසාධාරණයක් වෙනවා. සභාව කිසිම දැනුවත් වීමක් නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මොකද දැන් මා සතුව තිබෙනවා ලබන සභා වාරයට ඉදිරිපත් කිරීම සඳහා ප්‍රශ්න තුනක්. එතකොට මේ ප්‍රශ්න තුනට උත්තර නැති වුණාම ඒක කල් යනවා. එතකොට මට මේ ප්‍රශ්න තුන ඉදිරිපත් කරගන්නත් බැරි වෙනවා. ඒ වාගේම මේ ප්‍රශ්නය ගත්තොත් ලක්ෂ ගණනක බරපතළ මූල්‍ය වංචා සම්බන්ධ ප්‍රශ්නයක් මම අහලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම හිතන්නේ විෂයය භාර ලේකම්තුමියත් සනීපද නැද්ද මන්දා. මට එහෙමත් නිල නොවන ආරංචියක් ආවා අමාත්‍යාංශ ලේකම්තුමියත් අසනීප මට්ටමෙන් කියලා. අමාත්‍යාංශ ලේකම්තුමිය ඉන්නවා නේද? මට පේනවා. මේකට උත්තරයක් දෙන්න ඔබතුමියට පුළුවන්ද? උත්තර ලැහැස්තිද? මොකද ඇමතිතුමා උත්තර හදන්නේ නැහැ නේ. කවුද දන්නේ නැහැ, පත් කරලා තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ලේකම්තුමන්ලා අරහේ මෙහේ නොවෙයි. අපි කැමැති වුණත්, අකැමැති වුණත් දැන් මේකේ තනතුරු තිබෙනවා. ආණ්ඩු පක්ෂයේ සංවිධායක කියලා තනතුරක් තිබෙනවා. ඒක වැරැදියි. නමුත් වැරැදි වුණත් ඔබතුමන්ලා රීතිවලට ඇතුළත් කර ගත්තා. සභානායක කියලා ඉන්නවා. ඇත්තටම දැන් ඒ රීති පොතේ තිබෙනවා, ඇමතිවරයා නැත්නම් සභානායකවරයා, ආණ්ඩු පක්ෂයේ සංවිධායකවරයා ඒවාට පිළිතුරු සපයන්න ඕනෑය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙන්නාම නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මම දන්නේ නැහැ. එතුමන්ලාට වාහන දීලා, මාසයකට වාහනවලට පළාත් සභා යටතේ මුදල් වැය කරනවා. එතුමන්ලා කරන රාජකාරියක් නම් අපට පෙනෙන්න නැහැ. මේ සභාවට ඇවිල්ලා ඇමතිවරයා පැමිණි නැති දවසක අඩුම තරමේ කටයුතු කරන්නවත් එතුමන්ලා නැත්නම් එතුමන්ලාගේ ධුර මොකටද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇත්ත වශයෙන්ම මෙය කනගාටුදායක කාරණාවක්. ගරු මන්ත්‍රීවරු ප්‍රශ්න අහන්නේ මොකක් හරි සහනයක් බලාපොරොත්තුවෙන්. ඒ ප්‍රශ්නය පිළිබඳව ජනතාවට උත්තරයක් දෙන්න එම ගරු මන්ත්‍රීතුමා බැඳී සිටිනවා. විෂයය භාර ඇමතිවරයා නැත්නම්, සභාවේ නම් කරන වැඩ බලන ඇමැතිවරයෙක් හරි - මම නම් තවම දැනුවත් වෙලා නැහැ. සභානායකතුමාත් නැහැ. ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමාත් නැහැ. මේක හරි ප්‍රශ්නයක්.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, අපි ඉල්ලීමක් කරනවා. ඒ සම්බන්ධව සියලුම ලේකම්වරු හරහා, නැත්නම් අපේ සභානායක ඒ කට්ටිය හරහා ගරු ප්‍රධාන අමාත්‍යතුමා හරහා මොනවා හරි විශේෂ සාකච්ඡාවක් කරන්න කියලා මේ සම්බන්ධව. මේ වෙන අසාධාරණය සම්බන්ධව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලේකම්තුමිය, ඔබතුමිය මේ සම්බන්ධව දන්නවාද? මේ ප්‍රශ්නය සම්බන්ධව මොකක් හරි උත්තරයක්. එහෙම මොකුත් ලැහැස්ති කරලා නැද්ද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලේකම්තුමා පොඩ්ඩක් ඒ ගැන බලන්න. හරි. ඔබතුමාට මොකක් හරි උත්තරයක් අපි ලැහැස්ති කරලා දෙන්නම්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය තිබෙන්නේ මේ ප්‍රශ්නයටම අදාළව 2018 මැයි 22 මම සභාවේ ප්‍රශ්නයක් ඇහුවා. එතකොට ඒ ප්‍රශ්නයට දීපු උත්තරයත් ඉතාම පැහැදිලිව වැරැදියි කියන එක තහවුරු වෙලා තිබෙනවා මගේ මේ ප්‍රශ්නය හරහා. ඒ නිසා ඇත්තටම මට මේ ඇමතිවරයාම ඉන්න ඕනෑ මේ ප්‍රශ්නයට උත්තර ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මම සභා ලේකම්තුමාට උපදෙස් දෙනවා. අද මේ සභාව අවස්ථාව තුළ දී මට ඒ පිළිබඳව වාර්තාවක් ලබා දෙන්නය කියලා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අද මෙම සභාව අවසන් වීමට පෙරාතුව. ඇත්ත වශයෙන්ම මේ ප්‍රශ්නය කනගාටුදායක ප්‍රශ්නයක්. සණස ව්‍යාපාරය සම්බන්ධ ප්‍රශ්නයක් තමයි ඔබතුමා මේ අහලා තිබෙන්නේ. හැම තැනම සණස මහජනතාවගේ මුදල් අසාධාරණ ලෙස මංකොල්ල කාලා තිබෙනවා. හැමතැනම.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගිය සතියේ මම විගොඩ සණස සමිතිය ගැන ඇහුවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විගොඩ සණස සමිතිය, හැමදාම හැමතැනම කියනවා. මට හිතාගන්න බැහැ. හිතාමතාද දන්නේ නැහැ, මේ ප්‍රශ්න මහහරින්නේ. අදාළ අය මේවාට සම්බන්ධ ද දන්නෙත් නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පළාත පුරාම. මීට කලින් වත්තේ ගෙදර -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. ඔව්. වත්තේගෙදර, විගොඩ, ගම්පහ හැම තැනම. තදින්ම දැන් අපට මෙය ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මේ වාගේ බරපතළ ප්‍රශ්නයක් තිබෙන වෙලාවේ මම දන්නේ නැහැ. සමූපකාරයේ කොමසාරිස්වරයෙක් ඉන්නවා. ඒ අයත් මොකුත් දන්නේ නැහැයි කියනවා. ඇමතිතුමාත් ඉන්නවා. මෙහෙම යන්න ගියොත් මේක මහ අපරාධයක්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

අනික් එක ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඔබතුමාට පැහැදිලි වාර්තාවක් ලබා දෙන්නම්, මේ සභාව අවසන් වීමට පෙර.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ ප්‍රශ්නවලින් පීඩාවට පත් වෙන්නේ ඉතාම අඩියම, පහළම ඉන්න අපේ පළාතේ, ප්‍රදේශයේ ජනතාව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ ගැන සාකච්ඡා කරලා අපට වාර්තාවක් ලබා දෙන්න. ඊළඟ ප්‍රශ්නයත් එතුමාටමයි. ඒ කොච්චිකඩේ සණස. තුන්වැනි ප්‍රශ්නය. නැහැ. හතරවැනි ප්‍රශ්නයත් එතුමාටමයි. ඒත් කොච්චිකඩේ සණස. ඒ ප්‍රශ්නයත් නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඉදිරිපත් කරලා වැඩක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඉදිරිපත් කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

දෙකම ඉදිරිපත් කරනවා. ඉදිරිපත් කරලා වැඩක් නැහැ නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පස්වැනි ප්‍රශ්නය, රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් කෘෂිකර්ම, ඉඩම් ගරු ඇමතිතුමාට ප්‍රශ්නය ඉදිරිපත් කිරීමේ අවස්ථාව. එතුමියත් නැහැ.

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.)

ගරු සභාපතිතුමනි, එතුමිය නම් නැහැ. මේ තුන්වැනි වාරයේ මට මතක හැටියට එක්කෝ අඩුම දෙක. මම මේවා කියන්න ඕනෑ. ප්‍රශ්න අහනවා. පිළිතුරු දෙන්න මම ලැහැස්තියි. ගරු මන්ත්‍රීතුමිය නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා උත්තරය -

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

මේවා කියන්න ඕනෑ. නිකන් බොරුවට අහනවා. මට මේවා පැහැදිලි කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, මම මේ වැරැද්දකට කියනවා නොවෙයි. ප්‍රශ්න අහනවා නම් මන්ත්‍රීවරයෙක් එන්න ඕනෑ. මේ පැත්තට කථා කරනවා වාගේ අපි ඒවා ගැනත් කථා කරන්න ඕනෑ. දැන් බලන්න. මම දැන් මෙතැන හොඳ විස්තරයක් දෙන්න සිටියේ. අද මේ ගැන. වැඩක් නැහැ නේ. ගරු සභාපතිතුමනි, පිළිතුර සභාගත කරනවා.

* *[සභාගත කරන ලද පිළිතුර]*
*[Tabled Answer]*

***05.***

***රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ගරු කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳව අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/19/12)***

***ප්‍රශ්නය :***

*අ. සේනා දළඹු ව්‍යසනයෙන් හා වී ඇති බස්නාහිර පළාතේ වගාබිම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද?*

***පිළිතුර :***

*අ. දැනට හෙක්ටයාර 2.9 ක් පමණ බවට වාර්තා වී ඇත.*

***ප්‍රශ්නය :***

*ආ. මෙම වගා හානි නිසි ලෙස මෙතෙක් නිශ්චය කර නොමැතිද?*

***පිළිතුර :***

*ආ. නිශ්චය කර ඇත.*

***ප්‍රශ්නය :***

*ඇ. මෙම "සේනා" දළඹු ව්‍යසනය වළක්වා ගැනීමට සාර්ථක විද්‍යාත්මක ක්‍රමවේදයක් හඳුනාගෙන තිබේද?*

***පිළිතුර :***

*ඇ. මර්දනය සඳහා රසායනික මර්දන ක්‍රමවේද සාර්ථකව අත්හදා ඇත.*

***ප්‍රශ්නය :***

*ඈ. විදේශවලින් මෙරටට වගා බීජ ආනයනයේදී තත්ත්ව පරීක්ෂණයන්ට ලක්වන්නේද?*

***පිළිතුර :***

*ඈ. ඔව්.*

***ප්‍රශ්නය :***

*ඉ. බස්නාහිර පළාත ලෙස මෙවැනි ව්‍යසනයන්ගෙන් වගාවන් ආරක්ෂා කර ගැනීම සඳහා ක්ෂණික වැඩ පිළිවෙළක් සකස් කළ හැකි පහසුකම් ඔබ අමාත්‍යාංශය සතුව තිබේද?*

***පිළිතුර :***

*ඉ. ඔව්.*

***ප්‍රශ්නය :***

*ඊ. මින් ඉදිරියට මෙවැනි හදිසියේ ඇති විය හැකි ව්‍යසනයන්ට මුහුණ දිය හැකි ක්‍රමවේදයක් සකස් කරන්නේද?*

***පිළිතුර :***

*ඊ. ඔව්.*

***ප්‍රශ්නය :***

*උ. නොඑසේ නම් ඒ මන්ද?*

***පිළිතුර :***

*උ. අදාළ නොවේ.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හයවැනි ප්‍රශ්නයත් එතුමියගෙන්මයි. ඒත් ඔබතුමාටමයි.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ඒක නේ. ගරු සභාපතිතුමාට තේරෙනවා නේ. ඇයි මේ ප්‍රශ්න අහලා නිකන් බොරුවට වියදම් කරන්නේ. අද පළමුවැනි වතාව නොවෙයි. දෙවැනි වතාව නොවෙයි. තුන්වැනි වතාව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. ඔව්. අනික් එක මේ ප්‍රශ්න ඇතුළත් කළෙත් කළබලෙන්.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

කලබලෙන් දාන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කලබලෙන්. සභා කටයුතු කාරක සභාව යන කොට තමයි මට ප්‍රශ්නය අතින් ලියලා දෙන්නේ. අපි ඒවාට උදව් කරනවා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, පිළිතුර සභාගත කරනවා.

** [සභාගත කරන ලද පිළිතුර]*
*[Tabled Answer]*

***06.***

***රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ගරු කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳව අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/19/13)***

***ප්‍රශ්නය :***

*අ. බස්නාහිර පළාතේ වගාවන් සහා ජලය ලබා ගන්නා වාරිමාර්ග පද්ධතිය සහ ඇළ මාර්ග පද්ධතිය සම්බන්ධව නිසි හඳුනා ගැනීමක් කර තිබේද?*

***පිළිතුර :***

*අ. බස්නාහිර පළාතේ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් සුළු වාරිමාර්ග පද්ධති සහ ඇළ මාර්ග හඳුනාගෙන ඇත.*

***ප්‍රශ්නය :***

*ආ. ඇතැම් ප්‍රදේශවල මෙම කෘෂිභෝග වගාවට ජලය සපයන සුළු වාරිමාර්ග අවහිර කරමින් ගොඩනැගිලි තනා ඇති බව ඔබතුමා දන්නේද?*

***පිළිතුර :***

*ආ. ඔව්.*

***ප්‍රශ්නය :***

*ඇ. මෙම සුළු වාරිමාර්ග පද්ධති පිළිබඳ සැලසුම් ඔබ අමාත්‍යාංශය මගින් නිශ්චය කර ගැසට් කිරීමක් සිදු කර තිබේද?*

***පිළිතුර :***

*ඇ. නැත.*
*13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව පළාත් සභාව වෙත පැවරී ඇත්තේ සුළු වාරිමාර්ග පුනරුත්ථාපනය හා නඩත්තුව පමණකි. සුළු වාරිමාර්ග අවහිර කිරීමට අදාළව නීතිමය පියවර*

*ගැනීම හෝ ක්‍රියා මාර්ග ගැනීම 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත මගින් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇත.*

***ප්‍රශ්නය :***

*ඈ. ඇළ මාර්ග හෝ සුළු වාරිමාර්ග ගොඩකිරීම් අල්ලා ගැනීම්වලදී අදාළ කරගත හැකි නිසි ලෙස සීමා මායිම් සලකුණු කළ හැකි වාරි සැලසුම් මැනුම්කරණය කර ඇත්තේ කුමන වර්ෂයකදී ද?*

***පිළිතුර :***

*ඈ. අදාළ නොවේ. (ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් කාර්යයකි.)*

***ප්‍රශ්නය :***

*ඉ. එකී වාරිමාර්ග, ඇළ මාර්ග සම්බන්ධයෙන් ගැටලුවක් උද්ගත වුවහොත් ඒ පිළිබඳ මැනුම්කරණය කළ සැලැස්ම ලබාගත හැක්කේ ඔබ අමාත්‍යාංශයේ කුමන නිලධාරියාගෙන් ද?*

***පිළිතුර :***

*ඉ. අදාළ නොවේ. (ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් කාර්යයකි.)*

***ප්‍රශ්නය :***

*ඊ. එවැනි සුළු වාරිමාර්ග, ඇළ මාර්ග පිළිබඳ සැලසුම් සකස් කර ඒවා ගැසට් කර සංරක්ෂණය කිරීමේ වැඩ පිළිවෙළක් දියත් කරන්නේ කවදාද?*

***පිළිතුර :***

*ඊ. අදාළ නොවේ. (ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් කාර්යයකි.)*

***ප්‍රශ්නය :***

*උ. එසේ නොකරන්නේ නම් ඒ ඒ මන්ද?*

***පිළිතුර :***

*උ. අදාළ නොවේ.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න අවසානයි. මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා දැනුයි මට මේ වාර්තාව ලැබුණේ. ඒ ප්‍රශ්න ටිකට අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමාට විස්තර ටික භාර දුන්නාලු. මේ ප්‍රශ්නවලට කල් ගන්න කියලා. අධ්‍යාපන ඇමතිතුමාත් සභා ගර්භයේ නැහැ. ඒකයි මේකට හේතුව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මරු බඩුවකට භාර දීලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහ ඇමතිතුමාට භාර දුන්නා නම් ගරු මහ ඇමැතිතුමා සභාවේ ඉන්නවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, වැඩ බලන්න දෙන්න කියන්න එන කෙනෙකුට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි. මම නොවෙයි නේ ඒවා තීරණය කරන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එතුමාට දැන් ගොඩක් ප්‍රශ්නවලට උත්තර නැති නිසා සභාව මඟහරිනවා වාගේ අපට පෙනෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේක ෂෝක් කට්ටියට භාර දීලා තිබෙන්නේ. නියම කට්ටියට භාර දීලා තිබෙන්නේ. උත්තර දෙන්නයි. හරි වැරැදියි. මෙහෙම යන්න ගියාම - තව පුංචි කාලයක් මේ සභාව තිබෙන්නේ.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

මේ තරම් තැනකට ඇවිල්ලා වියදම් කරලා මේවද අපි කරන්නේ, ගරු සභාපතිතුමා. මොනවද මේ කරන්නේ?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, දැන් මේකත් එක්ක මම අර කලින් කියපු ප්‍රශ්නය මතු වෙනවා. ඒ නිසා මේ ප්‍රශ්න ටිකට පිළිතුරු මට අද දවසේ කුමන හෝ ආකාරයකින් සභාගත කරන්න කියලා ඉල්ලා සිටිනවා. අතුරු ප්‍රශ්න අහන්න මට ලබා වාරයේ ඉඩ තියලා ඊළඟ සභා වාරයට මගේ අද ප්‍රශ්න ටික ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩි ගැටලුවකුත් තිබෙන බව මට පේනවා. අපි බලමු. ලේකම්තුමා දැන් මට මේ අවශ්‍ය කාරණාව කිව්වා. අදාළ උත්තර සහ File ඔක්කොම අධ්‍යාපන ඇමතිතුමාට භාර දීලා තිබෙන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, එහෙමනම් හොඳයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සුමානේ නම් හම්බ වෙන එකක් නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හත්වැනි පළාත් සභාවේදී හම්බ වෙයි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එතුමාට ගොඩක් ප්‍රශ්නවලට උත්තර නැති නිසා මේ දවස්වල සභාවට එනවත් අඩුයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙහෙම යන්න ගියාම හරි කනගාටුදායකයි. අධ්‍යාපන ඇමතිතුමාත්. ඕවා කියන්න අනේ මට තේරෙන්නේ නැහැ. අපි ඔබතුමාට මොකක් හරි සහනයක් දෙන්න බලන්නම්.

**ගරු එස්. කුහවරදන්**
Hon. S. Kuhawarthan

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. අද වීරකේසරී, නක්කුරල් පත්තරේ තිබෙනවා, අපේ ලංකාවට Teachers ලා ඉන්දියාවෙන් ගේනවා කියලා ඇමති කෙනෙක් කියලා තිබෙනවා කියලා. මම ඒක සම්පූර්ණයෙන්ම, අපේ Graduate ලා, Traning Teachers ලා කී දෙනෙක් රස්සා නැතිව ඉන්නවාද? එහෙම ඉන්න කොට පිටරටින් ලංකාවට Teachers ලා ගේනවා කියන්නේ බස්නාහිර පළාත විධියට මට කනගාටුයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මධ්‍යම ආණ්ඩුවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා එච්චරම ඒ ගැන කලබල වෙන්න ඕනෑ නැහැ. ඇමතිවරු එක එක ප්‍රකාශ කරනවා නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ආණ්ඩුවට කියන්න.

**ගරු එස්. කුහවරදන්**
Hon. S. Kuhawarthan

ආණ්ඩුවට තමයි කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බස්නාහිර පළාතට නම් එහෙම දෙයක් සිද්ධ වෙන්නේ නැහැ.

**ගරු එස්. කුහවරදන්**
Hon. S. Kuhawarthan

බස්නාහිර පළාතට එහෙම එන අය ගන්නවා නම් ඒක සම්පූර්ණයෙන් වැරදියි කියලා දැන්මම මම කියනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි වගකීමෙන් කියන්නේ. එහෙම දෙයක් නැහැ.

# පෞද්ගලික ප්‍රකාශ කිරීම්
## PERSONAL EXPLANATIONS

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මම ස්තූතිවන්ත වෙනවා. බස්නාහිර පළාත් සභාවට අයිති පාසල්වල සිසු දරුවන්ට ගුණාත්මක වූ අධ්‍යාපනයක් සහතික කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ ප්‍රශස්ථ අධ්‍යයන කාර්ය මණ්ඩලයක් සිටිය යුතුය. එනමුත් බස්නාහිර පළාත් සභාව සතු පාසල්වල අධ්‍යයන කාර්ය මණ්ඩලවල අඩුව පිළිබඳව අප මෙම සභාවේත්, අමාත්‍යාංශ උපදේශක කාරක සභාවේත්, කලාප ව්‍යුහ කමිටුවේත් කෙතරම් සාකච්ඡා කළත් ඊට තිරසාර වැඩ පිළිවෙළක් මෙතෙක් ක්‍රියාත්මක නොවීම මත යම් යම් අවස්ථාවල පන්ති කාමරයේ ඉගැන්වීම් ක්‍රියාවලියට බාධා ඇති වූ අවස්ථා එමටය. මෙම තත්ත්වය තුළ බස්නාහිර පළාත් සභාවට අයත් පාසල්වල අධ්‍යාපන මට්ටම කඩාවැටීම නොවැළැක්විය හැක. එම නිසාම පළාතේ අධ්‍යාපන මට්ටම පහත වැටීමට ලක් වී ඇත. මෙයට ප්‍රධාන හේතුව වුණේ, ප්‍රශස්ථ අධ්‍යයන කාර්ය මණ්ඩලයක් ප්‍රමාණාත්මකව අප සතු නොවීමය. මෙම තත්ත්වය මඟහරවා ගැනීම සඳහා රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2016 ජනවාරි 07 වැනි දින නිකුත් කර ඇති 01/2016 දරන චක්‍රලේඛය - එම චක්‍රලේඛයේ සඳහන් වන්නේ පාසලකට සිටිය යුතු අධ්‍යයන කාර්ය මණ්ඩලය තීරණය කිරීම සම්බන්ධව මෙම ගරු සභාවේ මම අවධානය යොමු කරනවා. මීට පෙර නිකුත් කර තිබූ සියලු විධිවිධාන අභිබවා මෙම චක්‍රලේඛයේ උපදෙස් 2016.01.01 දින සිට බලපැවැත්වෙනු ඇත. මීට පෙර බලපැවැත් වූ සියලු චක්‍රලේඛ මගින් අධ්‍යාපන කාර්ය මණ්ඩලය තීරණය කර ඇත්තේ පාසලේ සිටින සිසුන් සංඛ්‍යාව පදනම් කරගෙනය. එමගින් නියමිත සිසුන් සංඛ්‍යාවට අඩුවෙන් සිටින පන්තියකට ගුරුවරයෙකු ලබා ගැනීම අපහසු වී තිබිණ. මෙම චක්‍රලේඛය මගින් අවම වශයෙන් පාසලේ පවතින එක පන්තියකට එක් කාර්යමණ්ඩල සාමාජිකයෙකු බැගින් ලබා දීමට අපේක්ෂා කර ඇත.

එපමණක් නොව ගරු සභාපතිතුමනි, මෙම චක්‍රලේඛයේ උපලේඛන අංක 01 හි, උදාහණයක් ලෙස මම මෙයින් සඳහන් කරන්න කැමැතියි. අපි සාමාන්‍යයෙන් එම චක්‍රලේඛයේ තිබෙන එක උදාහරණයක් ගත්තොත් පාසලක පන්ති කාමර 15 ක් තිබෙනවා නම්, යෝග්‍ය ගුරුවරුන් සංඛ්‍යාව කියලා එහි හඳුන්වලා තිබෙනවා - පන්ති කාමර 15 ක් තිබෙනවා නම් පොදුවේ ගුරුවරු 17 ක්, ඊට අමතරව ඉංග්‍රීසි ගුරුවරු දෙන්නෙක් සිටිය යුතුයි කියන කාරණාව. ඒ කියන්නේ පන්ති කාමර 15 ක් තිබෙන පාසලකට ගුරුවරු 19 ක් මේ චක්‍රලේඛයෙන් බඳවා ගැනීමට ඉඩ දීලා තිබෙනවා. ඒ කියන්නේ පන්ති කාමර ගණන 15 ක් නම් තවත් ගුරුවරු 04 ක් වැඩියෙන් මේ පාසලේ සිටින්නට හැකියාව මේ චක්‍රලේඛය හරහා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට බලය දීලා තිබෙනවා. නමුත් අද වන විට ගත්තොත් එහෙම බඳවා ගැනීමක් අපේ පළාත් සභාවේ සිද්ධ වෙන්නේ නැහැ. මේ වන විට මෙම චක්‍රලේඛය ප්‍රකාරව බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශය ගුරුභවතුන් බඳවා ගැනීමක් සිදු නොකිරීමෙන් පළාතේ අධ්‍යාපනය ලබන දරුවන්ට බපරතළ අසාධාරණයක් සිදුව ඇත.

මම උදාහරණයක් ගත්තොත් කැලණිය අධ්‍යාපන කලාපයේ, මේ 01/2016 කියන චක්‍රලේඛය අනුව කැලණිය අධ්‍යාපන කලාපයට ගුරුවරුන් බඳවා ගන්නේ නම් ගුරුවරුන් 3700 ක් කැලණිය අධ්‍යාපන කලාපයට විතරක් බඳවා ගන්නට පුළුවන්. හැබැයි ගරු සභාපතිතුමනි, දැන් අධ්‍යාපන අමාත්‍යාංශය කැලණි කලාපයට බඳවා ගැනීමට අනුමැතිය දීලා තිබෙන්නේ 3533 ක්. ඒ කියන්නේ මේ චක්‍රලේඛයේ ඉඩකඩ තිබෙන ගුරු ප්‍රමාණයට වැඩිය ගුරු භවතුන් 167 ක් අඩුවෙන් තමයි අපේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් බඳවා ගැනීම් සිද්ධ කරන්නේ. ඒකට දෙමළ බස උගන්වන ගුරුවරු, IT ගුරුවරු, ශාරීරික අධ්‍යාපන ගුරුවරු බඳවා ගන්න කටයුතු සූදානම් කරලා නැහැ. උදාහරණයක් හැටියට මම කැලණි කලාපය ගැන කිව්වේ. 3700 න් 3533 යි බඳවා ගන්න අනුමැතිය දීලා තිබෙන්නේ. ඒ වාගේ බස්නාහිර පළාතේ හැම කලාපයකටම මේ ආකාරයෙන් රේඛීය අමාත්‍යාංශයෙන් නිකුත් කරපු චක්‍රලේඛය අනුව ගුරුවරුන් බඳවාගන්න ඉඩකඩ දීලා තිබෙද්දී බස්නාහිර පළාත් සභාව අඩුවෙන් ගුරුවරු බඳවා ගැනීම මත අපේ පළාතේ දරුවන්ගේ අධ්‍යාපනයට විශාල ගැටලුවක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා මම ගරු ඔබතුමා මාර්ගයෙන් මේ අවස්ථාවේ ගරු අධ්‍යාපන ඇමැතිතුමා නැහැ. අධ්‍යාපන ඇමතිතුමා සිටියත් මම සඳහන් කරන්නේ, ගරු ප්‍රධාන අමාත්‍යතුමා අපේ මේ පළාත් සභාවේ කාලය අවසන් වුණත්, අඩුම ගණනේ ඊළඟ පළාත් සභාව එනකොටවත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ කඩිනම් අවධානය යොමු කරලා රේඛීය

අමාත්‍යාංශයේ 01/2016 කියන චක්‍රලේඛය අනුව බස්නාහිර පළාතේ දරුවන්ට අධ්‍යාපනය හදාරන්නට අවශ්‍ය ගුරු සම්පත පළාතේ පාසල් ටික වෙත ලබා දෙන වැඩ පිළිවෙළ දැන්වත් ආරම්භ කරන්න කියන කාරණය මම මේ වෙලාවේ මතක් කරනවා. කැලණි කලාපය ගැන කිව්වොත් 2018 අවුරුද්දෙත් අපේ රේඛීය අමාත්‍යාංශයට මේ නව චක්‍රලේඛය අනුව ගුරුවරුන් බඳවා ගන්න ඉඩ දෙන්න කියන කාරණාව ලිඛිතව කැලණි කලාපයෙන් 2018 වසරේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉල්ලීම කරලා තිබෙනවා. නමුත් මෙතෙක් ඒ කාරණාවට අනුමැතිය දීලා නැහැ. මම අර පෙර සඳහන් කරපු ආකාරයට කැලණි කලාපයට චක්‍රලේඛයෙන් හිමි ගුරුභවතුන්ගෙන් 167 ක් අඩුව තමයි ගුරුවරුන් බඳවාගන්න ඉඩ දීලා තිබෙන්නේ. ඒ නිසා රේඛීය අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව අවශ්‍ය ඉඩකඩ දීලා තිබෙද්දී පළාතේ දරුවන්ට බරපතළ අසාධාරණයක් අපේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිදු කරනවා. මේක ඉතාම කනගාටුදායක කාරණයක්.

මේ චක්‍රලේඛය ක්‍රියාත්මක වන්නේ 2016.01.01 දින සිට. 2016 සිට 2019 අවුරුද්ද වනතුරු ඒ චක්‍රලේඛය ප්‍රකාරව අපේ පළාත් අමාත්‍යාංශයට ගුරුවරුන් බඳවාගන්න කටයුතු නොකිරීම පිළිබඳව මම දැඩි ප්‍රසාදය පළ කරනවා. ඒක පළාතේ දරුවන්ට කරන මහා අපරාධයක්. ඒ නිසාම තමයි පළාතේ අධ්‍යාපනය කඩා වැටීමක් සිද්ධ වෙලා තිබෙනවා නම් සිද්ධ වෙන්න ප්‍රධාන හේතුව. අද ගුරුවරයෙක් කිසියම් අසනීප නිවාඩුවක්, ප්‍රසූත නිවාඩුවක්, විදේශ නිවාඩුවක් ගියාම පන්ති කාමරයේ උගන්වන්න ගුරුවරු නැහැ. හැබැයි ඒක පිරිමහ ගන්න පුළුවන් ආකාරයේ වැඩ පිළිවෙළක් මේ 01/2016 කියන චක්‍රලේඛයෙන් ඉඩකඩ දීලා තිබෙනවා. මම අර උදාහරණය කිව්වේ පන්ති කාමර 15 ක් තිබෙන පාසලකට අනිවාර්යයෙන් 15 යි. ඊට අමතරව තව 04 ක් බඳවාගන්න මේ චක්‍රලේඛයෙන් ඉඩකඩ දීලා තිබෙනවා. ඒ නිසා එක ගුරුවරයෙක් නිවාඩු ගියොත්, ප්‍රසූත නිවාඩු ගියොත් තව ගුරුවරයෙක් පාසලට එනකන් ඉන්න අවශ්‍ය නැහැ. ඒ පන්ති කාමරයට අවශ්‍ය ගුරුවරයා මේ චක්‍රලේඛය හරහා වැඩිපුර බඳවා ගැනීමට ඉඩකඩ දීලා තිබෙද්දී, අපේ අමාත්‍යාංශය මේ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන නැති එකම මොනතරම් බරපතළ අපරාධයක්ද කියන කාරණාව මම මතක් කරනවා. ඒ නිසා ගරු ඔබතුමාගේ මාර්ගයෙන් නැවතත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට, මේ අපේ කාලය අවසන් කාලය වුණත්, ඊළඟ පළාත් සභාව ආරම්භ වෙද්දිවත් අපේ පළාතේ දරුවන්ට රේඛීය අමාත්‍යාංශයෙන් නිකුත් කරලා තිබෙන 01/2016 චක්‍රලේඛය ප්‍රකාරව දරුවන්ට අධ්‍යාපනය හදාරන්න අවශ්‍ය ගුරු සම්පත ලබා දෙන වැඩ පිළිවෙළ ආරම්භ කරන්නය කියන කාරණාව මතක් කරනවා.

ඒ චක්‍රලේඛයට බාහිරින් තව එක කාරණයක් කියන්න ඕනෑ. පළාතට ගුරුවරුන් බඳවාගන්නේ තවම අවුරුදු හතරකට, පහකට එහා තිබුණු විභාගයෙන්. මට දැනගන්න තිබෙන කාරණා අනුව දකුණු පළාත් සභාවේ ගුරුවරු බඳවා ගන්නේ විභාගයකින් නොවෙයි. උපාධිය සමත් අය ප්‍රායෝගික සම්මුඛ පරීක්ෂණයට ලක් කරලා, දරුවාට හරියට උගන්වන්න පුළුවන් ගුරුවරු බඳවා ගන්න වැඩ පිළිවෙළක් දකුණු පළාත් සභාවේ ක්‍රියාත්මක වෙනවා. අද අපි දන්නවා, අවුරුදු හතරකට, පහකට ඉස්සෙල්ලා තිබුණු විභාගයෙන් ගුරුවරු බඳවා ගන්න ගියාම වයස ඉක්මවා ගිහිල්ලා, අවුරුදු 50 ට කිට්ටුව ගිහිල්ලා දරුවන්ට සංවේදී ගුරුවරයෙක් ලබා ගැනීමේ නොහැකියාව තිබෙනවා. එක්කෝ මේ විභාග ප්‍රමාද නොකර අවුරුදු දෙකෙන් දෙකට හරි විභාග තියලා අලුත් ගුරුවරු ගන්න වැඩ පිළිවෙළක් කරන්නට ඕනෑ. ඒ වාගේම අපේ මේ බඳවාගන්න ගුරුවරුන්ට දෙන පුහුණුව ඉතාම ප්‍රමාණවත් නැහැ. මේ සති දෙක තුනක, මාසයක, එකහාමාරක පුහුණුවක්. ඔබතුමා මාර්ගයෙන් මම යෝජනා කරනවා. අඩු වශයෙන් මේක හරියට කරගන්න නම් මාස 06 ක ස්ථිර වැඩ පිළිවෙළක ගුරු පුහුණුවකට මේ ගුරුවරු යොමු කරලා දරුවා වෙත ඒ ගුරුවරයා යොමු කරන්න ඕනෑ. එසේ නොවෙන තාක් කල් ගුරු සේවය කියන එක හරියට සිද්ධ වෙන්නේ නැහැ. අද බොහෝදෙනෙක් පන්ති කාමරයට එන්නේ 7.30 ට ඇවිල්ලා 1.30 ට යන්න. හැබැයි ඉතිහාසයේ එහෙම නොවෙයි. බොහොම සංවේදී ගුරුවරු පාසල, දරුවන් වෙනුවෙන් බොහෝ කැපවීමක් කරනවා. අද කොහේ හරි රැකියාවක් කරන, ඒ රැකියාවට යොමු වෙලා ඉඳලා එකතැන ඉඳලා පල් වුණු - මම උපාධිධාරීන්ට අගෞරව කරනවා නොවෙයි. අර වයස ඉක්මවා ගිහිල්ලා අර 04.30 වනතුරු සේවය කරලා පුරුද්දට. වේලාසන ගෙදර යන්න 1.30 ට සේවය අවසන් කරලා ගෙදර දුවන්න යන එන ගුරුවරු තමයි අපි දැන් බඳවා ගන්නේ. ඒ නිසා මම යෝජනා කරන්නේ ඉඩකඩ තිබෙනවා නම්, හැකියාව තිබෙනවා නම් - නැති වෙන්න බැහැ. තොරතුරු තිබෙන විධියට දකුණු පළාත් සභාවේ ගුරුවරුන් බඳවා ගන්නේ උපාධිධාරීන්. ප්‍රායෝගික සම්මුඛ පරීක්ෂණයකින්. ඇයි අපට බැරි? ප්‍රායෝගික සම්මුඛ පරීක්ෂණයකින්

[ගරු ගුණසිරි ජයනාත්]

ගුරුවරයෙක් වෙන්නට අවශ්‍ය මූලික සුදුසුකම් ටික ප්‍රායෝගිකව පරීක්ෂා කරලා බඳවා ගන්න ක්‍රමවේදය ඇති කරනවා නම් මේක වඩා යහපත් කාරණාවක් වෙනවාය කියන කාරණය මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බොහොම ස්තුතිවන්ත වෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා ඇත්ත වශයෙන්ම ඉදිරිපත් කළේ -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

37(1) යටතේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් වාඩි වෙන්න. ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ඒ කාරණාව ඇත්ත වශයෙන්ම ඉතාමත්ම වැදගත් කාරණාවක්. මොකද එතුමා මේ කොළ 05 ක ලිපියක් තමයි මට ඉදිරිපත් කළේ. මෙතුමා මෙය අතින් ලියලා තිබෙන්නේ. ඒ තිබෙන උවමනාවම අපට පැහැදිලිව පෙනෙනවා. එතුමා අධ්‍යාපනයට සම්බන්ධ මන්ත්‍රීවරයෙක් වශයෙන් විශේෂයෙන්ම ගුරු හිඟය පිළිබඳව කථා කරන කොට මේ සභා ගර්භයේ ඇමතිතුමාවත් නැහැ. ඒක කනගාටුදායක කාරණාවක්. ලේකම්තුමා නම් ඉන්නවා. ලේකම්තුමා මේ ගැන සානුකම්පිතව සොයා බලා ඉක්මණින්ම මේකට පියවරක් ගන්න. මමත් මේක දන්නවා. සමහර අලුත් පත්වීම් ලැබුවාට පස්සේ මහ ඇමැතිතුමා එදා ලස්සන කථාවක් කළා. මහ ඇමැතිතුමාගේ හොඳ කථාවක් මම එදා ඇහුවා. නාඩා ආයතනයේදී ගුරු පත්වීම් ප්‍රදානය කිරීමේ අවස්ථාවේදී. ඉතින් මේ ගුරුවරු මාසයක පුහුණුවට දාන්න ඉස්සෙල්ලා පාසලට දානවා. මේ ක්‍රමවේදය වැරැදියි නේ? ඉතින් ගුරු පුරප්පාඩු ඇති වෙනවා. ගුරුවරුයා ඉස්කෝලයට දාලා ආයිත් මාසයක් ඉස්කෝලේ නැහැ. ඉතින් මේ ක්‍රමවේදය තුළ අධ්‍යාපනය කඩා වැටෙන එක අහන්න දෙයක් නොවෙයි. මේවා වෙනස් කරන්න ඕනෑ ලේකම්තුමා. අධ්‍යාපන ඇමැතිතුමාට කිව්වාට එතුමා නම් ඇහුම්කන් දෙන්නේ නැහැ. ඔබතුමන්ලා මැදිහත් වෙලා, ප්‍රධාන ලේකම්තුමාත් ඉන්නවා. මේ ගැන හොඳ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. නැත්නම් හරි අපරාධයක් මේ දරුවන්ට කරන්නේ. දැන් හැමදාම පත්තරවල ප්‍රධාන ප්‍රවෘත්තිය ගම්පහ ගුරුවරු නැහැ. දෙමව්පියෝ ඇවිල්ලා උපවාස කරනවා. කලාප කාර්යාලයේ උපවාස කරනවා. දිගින් දිගටම යන මේ ක්‍රියාදාමය එපමණ හොඳ නැහැ. ඉතින් මේ පිළිබඳව අපේ අධ්‍යාපන ලේකම්තුමාටත් විශාල කාර්ය භාරයක් තිබෙනවා. අපටත් තිබෙනවා. අපට මේකෙන් මඟ හරින්න බැහැ. අපට මේ කාරණාවෙන් නිශ්ශබ්ද වෙන්න බැහැ. අපි හැමෝම එකතු වෙලා මේ පිළිබඳව කඩිනම් තීන්දුවක් ගන්න ඕනෑ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, 37 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මම අද එනකොට මගේ ගමේ වෙළඳසැල්වල කට්ටිය ඇවිල්ලා උදේ පාන්දරම මාව හම්බ වුණා. අද සෑම පත්තරයකම Headline තිබෙනවා. රේගු අධිපතිවරයා මාරු කරලා, වැඩ තහනම් කරලා අද රේගුව ස්ට්‍රයික්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා 37 (1) කියන්නේ ඔබතුමාට ඒකට වරප්‍රසාදයක් -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

නැහැ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, සමාවෙන්න. මෙහෙම යන්න දෙන්න බැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මෙහෙම නේ සභාපතිතුමා මම කියන දේ හරිද වැරැදිද කියලා ඔබතුමා ඉස්සෙල්ලා කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේක ඔබතුමාට අදාළ එකක් නොවෙයි. ගෙදර කට්ටිය හම්බ වෙලා ඔබතුමාට තර්ජනය කළා නම් ඒක වරප්‍රසාදයක්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේක වරප්‍රසාද නොවෙයි. යෝජනාවක් දාලා වෙනම කථා කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

වෙළඳ කටයුතු පළාත් සභාවට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔබතුමා භාණ්ඩ ආනයනය කරනවාද? ඒක වෙනම ප්‍රශ්නයක්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පළාත් සභාවේ සමූපකාර ආයතනවල විකුණන්න බඩු නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

භාණ්ඩ ආනයනය කළත් ඒක වරප්‍රසාදයක් නොවෙයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

සමූපකාරවල විකුණන්න බඩු නැහැ. මිනිස්සුන්ට ගන්න බඩු නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා 37 (1) කියන්නේ ඔබතුමාගේ වරප්‍රසාද කඩවීමක්. ඉතින් ඒ ගැන ඔබතුමාට -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

තමුන්නාන්සේ මේක හරියට අධ්‍යයනය කරන්න. මම ඔබතුමාගෙන් අහන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

37 (1) යටතේ අවස්ථාව දෙන්න බැහැ. ඔබතුමා ඇවිල්ලා කලින් මට දෙන්න තිබුණා -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය යටතේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කලින් දුන්නා නම් පෞද්ගලික ප්‍රකාශ යටතේ කථා කරන්න දෙනවා.

[සභාවේඝෝෂා]

කරුණාකර වාඩි වෙන්න. ඕවා වරප්‍රසාද නොවෙයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම හිටපු වෙළඳ ඇමැතිතුමා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඕවා වරප්‍රසාද ප්‍රශ්න නොවෙයි ගරු මන්ත්‍රීතුමා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

වෙළඳ කටයුතුයි, එතකොට අපට සමූපකාරයි දෙකම තිබෙනවා. අපේ යුතුකමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපේ යුතුකමක් තිබෙනවා මේ ප්‍රශ්නය බස්නාහිර වැසියන්ට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට කථා කරන්න දෙන්න පුළුවන්. ක්‍රමවේදයක් තිබෙනවා. 37 (1) කියලා කථා කරන්න දෙන්න මට බැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ආණ්ඩුව කරගන්න බැරි හොර ඇමැතිවරු මේ බලන්න -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

විනය ආරක්ෂා කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පන්නන එවුන්. හොරු. පට්ටපල් හොරු.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සමූපකාරයට කරපු හරිය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මුදල් ඇමැතිතුමාගේ ලේකම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න. අපි න්‍යාය පත්‍රයට යමු.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

හාල්මැස්සෝ ටික, අල ටික, පරිප්පු ටික, බොම්බයි ලූණු ටික මේවා කඩවල නැති වුණාම මිනිස්සු කන්නේ කොහොමද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීතුමා සමාවෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම කියන්නේ කොස්, බතල කන්න යැයි.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ඒක හැන්සාඩ් එකෙන් අයින් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඔබතුමා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඔබතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට තව ඉඩ දෙන්න බැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපට ඡන්දය දීපු මිනිස්සු ඉන්නේ බස්නාහිර පළාත් සභාවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට ඉඩ දෙන්න බැහැ. ඔබතුමා 37 (1) කියලා ඔබතුමාගේ වරප්‍රසාද කඩවීමක් මෙතැන නැහැ නේ? ඔබතුමා රටේ ප්‍රශ්න කථා කරන්න -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සභාවේ කාලය නාස්ති කරන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ රැස්වීම.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

තමුන්නාන්සේ නීතිඥයෙක් වුණාට මෝඩයෙක් වෙන්න එපා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔබතුමා අපිත් එක්ක පැටලෙන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කරුණාකරලා වාඩි වෙන්න කොඩිකාර මන්ත්‍රීතුමා. වාඩි වෙන්න. ඔබතුමා ආදර්ශවත් වෙන්න ඕනෑ. ඔබතුමා ඉදිරියේ අපේ රටේ නායකයෙක් වෙනවා. සභා කටයුතු ගරු ඇමැතිතුමාට අවස්ථාව සභාවේ රැස්වීම් සම්බන්ධ යෝජනාව ඉදිරිපත් කිරීමට.

## පළාත් සභාවේ රැස්වීම
PROVINCIAL COUNCIL MEETING

**ගරු සුමිත්ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumithlal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

ගරු සභාපතිතුමනි, මගේ ඇස් දෙකේ ආබාධයක් නිසා මේක ඉදිරිපත් කිරීමේ හැකියාව පොඩ්ඩක් අඩුයි. ඒ නිසා මම මේක ඉදිරිපත් කරන්න කියලා කරුණාකරලා වෙනත් කාට හරි -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපේ කෘෂිකර්ම ඇමැතිතුමාට දෙන්න. ඇත්තටම ආබාධයකින් ඉන්නේ.

***යෝජනාව :***

*"2019.02.18 සඳුදා දිනය සභා රැස්වීම පැවැත්වෙන දිනයක් ලෙස 2019.01.22 දින මෙම පළාත් සභාව තීරණය කළ නමුදු, ඒ කිසිත් නොතකා 2019.01.23 දින පැවැත් වූ සභා කටයුතු කාරක සභා රැස්වීමේදී එළඹුණු එකඟතාවය සැලකිල්ලට ගෙන, අද දින (2019.02.05 දින) විසිර යෑමෙන් අනතුරුව, මෙම පළාත් සභාව 2019.02.20 දින (බදාදා දින) පෙ.ව. 09.30 ට රැස්විය යුතු යැයි ද, 2019.02.18 (සඳුදා දිනය) හා 2019.02.19 (අඟහරුවාදා දිනය) යන දිනයන් සභා රැස්වීම් නොපැවැත්වෙන දිනයන් ලෙස සලකා ක්‍රියා කළ යුතු යැයි ද, මෙම පළාත් සභාව තීරණය කරයි."*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳව සභාවේ එකඟතාවය.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මීට ඉහත මේ පළාත් සභාවේ ඉදිරිපත් කරලා දිනයක් වෙන් කළා. සභා කටයුතු එකේ ඒ දිනය වෙනස් කරන්න හේතුව මොකක් කියලා අහන්න කැමැතියි. මොකද, බදාදා දවසක සියලු මන්ත්‍රීවරු සහ සියලු ආයතනවල මහජන දිනය පවත්වන දවසක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙහෙමයි මන්ත්‍රීතුමා. ගම්පහ දිස්ත්‍රික්කයේ ග්‍රාම ශක්ති පිළිබඳව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් විශේෂ රැස්වීමක් සංවිධානය කරලා තිබෙනවා. ඒ පිළිබඳව ගරු ප්‍රධාන ඇමැතිතුමා ඇතුළු ඇමැතිවරුත්, මන්ත්‍රීවරුන්ටත් එතුමා ආරාධනා කරලා තිබෙනවා. ඉදිරියේදීත් ආරාධනා කරාවි. ඒ නිසා තමයි ප්‍රධාන ලේකම්තුමාගේ ඉල්ලීම පරිදි එදා සභා කටයුතු කාරක සභාවේදී දිනය වෙනස් කරමු කියලා අපි තීරණයක් ගත්තේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මේ රැස්වීම බදාදා තියන්නේ කොහොමද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සාමාන්‍යයෙන් එහෙම වෙනවා. අපි එහෙම කරනවා නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

බදාදා රැස්වීම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වැදගත් අවස්ථා එනකොට -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

බදාදා මහජන දින පවත්වන නිල දවසක් නේ? එහෙම නම් වෙන දවසක් දාන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා අතිගරු ජනාධිපතිතුමා එනකොට අපට අහක දාන්න බැහැ. අපට ඒවා පිළිපදින්නේ නැතුව බැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සඳුදා ජනාධිපතිතුමා එන නිසා කල් දාපු එක හරි. මම කියන්නේ බදාදා මහජන දිනය පවත්වන දවසක් නේ? නිලධාරීන් සහ මන්ත්‍රීවරුන්. එහෙම නම් වෙනත් දිනයක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහජන දිනය එච්චරම -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එහෙම නම් වෙනත් දිනයක පවත්වන්න ඕනෑ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

සියලුම පක්ෂවල එකඟත්වයෙන් තමයි ඒ තීන්දුව එදා සභා කටයුතු එකේදී ගත්තේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පක්ෂවල එකඟත්ව ගත්තාට මන්ත්‍රීවරු සභාවට එන්න එපැයි. මේ සභාවේ අද ඉන්න මන්ත්‍රී සංඛ්‍යාවත් පේනවා නේ? මේ තිබෙන තත්ත්වයෙන් ගියොත් එහෙම බදාදාට කොහොමත් සභාව පත්වන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා විරුද්ධ නම් මට සභාවේ මතය විමසන්න වෙනවා. එච්චරයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

විරුද්ධයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා විරුද්ධ නම් මට විරුද්ධයි කියන්න.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු සභාපතිතුමනි, බදාදා අපේ මහජන දිනය.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

බදාදා සභාවක් පවත්වන්න බැහැ. බදාදා සභාවක් තියන්නේ නැහැ. ඔබතුමා හොඳාකාරවම දන්නවා මාසයකට දවස් දෙකක් තිබෙනව අඟහරුවාදා උදේ 09.30 ට මෙතැන කීදෙනාද හිටියේ කියලා. බදාදා දිනයේ කිසිම තේරුමක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අතිගරු ජනාධිපතිතුමා තමයි මේ රැස්වීමට -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සඳුදා ඒකට දිනය වෙන් කරපු එකේ ප්‍රශ්නයක් නොවෙයි තියෙන්නේ. බදාදා දිනයේ කරන්න බැරිකම. එහෙම නම් වෙනත් දිනයක් දාන්න ඕනෑ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මන්ත්‍රීතුමා ඕක ඔච්චර ඇදගෙන යන්න එපා. වර්ෂයේ අවසන් සභා වාරයේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ මට පුළුවන් තීරණයක් ගන්න.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, මේ සභා වාරයේ අවසන් සභා කිහිපයයි තියෙන්නේ. මේක ගැටළුවක් කරගන්න එපා. මහජනයාත් එක්ක එකතු වෙන්න පුළුවන් තවත් දිනයකදී. මොකද, එදා සභා කටයුතු කාරක සභාවේදී ඒ තීන්දුවට ආවේ පක්ෂ විපක්ෂ සියලු ගරු මන්ත්‍රීවරුන්ගේ එකඟත්වයත් එක්ක.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එදාට දාන්න තිබුණා නේ?

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ඒ තීන්දුව ගත්තේ එදා කල් වැඩි නිසා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සුමාන හතරක් තියෙනවා නේ? සතියේ තව දවස් තියෙනවා නේ?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, මට විනාඩියක් අවසර දෙන්න. සභා කටයුතු කාරක සභාවට මේ සහභාගී වෙන්නේ සියලුම දෙනා මන්ත්‍රීවරු. ඒ මන්ත්‍රීවරු බොහොම ශ්‍රද්ධාවෙන් බදාදා දිනය ගන්න ඇති. නමුත් විශාල ගැටළුවක් තිබෙනවා. පළමුවැනි උදාහරණය ගත්තොත් මහ ඇමැතිතුමා ළඟට එන සංඛ්‍යාව 400 යි, 500 යි. අධ්‍යාපන අමාත්‍යාංශයට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

1500 යි.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ඇමැතිතුමා උදේට ආවොත් රෑට යන්නත් බැහැ. එන්නේ නැහැ. අපේ අමාත්‍යාංශවලටත් 15 ක් 20 ක් හරි එනවා. ඒ නිසා මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව අනුව හැකියාවක් තිබෙනවා බදාදා දිනය වෙනස් කරලා වෙනත් දවසකට ගන්නවා නම් ජනතාව වෙනුවෙන් ගත්තු තීන්දුවක් කියලා මම විශ්වාස කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඇත්තටම මගේ පුද්ගලික ගමනක් යන්න තිබෙනවා. නමුත් මම ගියේ නැත්තේ -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, එදා හවස ගන්න කෝ?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

පොඩ්ඩක් ඉන්න මන්ත්‍රීතුමා. ඇත්තටම මම ගියේ නැත්තේ ගරු සභාපතිතුමනි, මේ දවස්වල හරියට සෙනඟ එනවා. පව්. ඒ නිසා මම කියන්නේ බදාදා නැතුව වෙනත් දිනයක් ගමු කියන එකයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම එකඟයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

බ්‍රහස්පතින්දා යෝජනා කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම මේවා තනියම ගන්න තීරණ නොවෙයි. මම තනියම කිසිම තීරණයක් ගන්නේ නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

දවල් 01.00 ඉඳලා රෑ 8.00 වෙනකල් ගන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කොඩිකාර මන්ත්‍රීතුමා මට මේ වැඩේ කරගෙන යන්න දෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

හවස් වරුවට. උදේ වරුවේ රැස්වීම තියෙනවා නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි එකඟයි නේ? එහෙම නම් බ්‍රහස්පතින්දා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

බ්‍රහස්පතින්දා ඕනෑ නැහැ නේ? අර මෙරිල් පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඊළඟ අඟහරුවාදට යමු.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කාලය යනවා වැඩියි නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඊළඟ අඟහරුවාදාට දාන්න පුළුවන් නේ? අඟහරුවාදා දවස් දෙකයි නේ තියෙන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අනෙක් සභාවට ළං වෙනවා නේ?

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

සභා කටයුතු කාර්ය මණ්ඩලයට කරන්න ගොඩක් -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මාසයකට අඟහරුවාදා දවස් දෙකයි තියෙන්නේ. අනෙක් දවස් දෙක නිකම් තියෙනවා නේ? ඒ දවස් දෙකෙන් දාන්න පුළුවන්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගොඩක් කල් දාන්න බැහැ. අනෙක් සභාවට ළං වෙන නිසා බ්‍රහස්පතින්දා හොඳයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමා ඇතුළු ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමාත් කියනවා බ්‍රහ්සපතින්දාට ගමු කියලා. ඒකට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නම් අපේ පළාත් සභා රැස්වීම ඊළඟ බ්‍රහස්පතින්දා උදේ 09.30 ට පැවැත්වීමට තීරණය කරමු. 21 නේද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, 37 (1) යටතේ මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මේ ගිය සතියේ අපේ ගිණුම් කාරක සභාවේ සහෝදර මන්ත්‍රීවරු විදේශගත වුණා. මගේ කිසිම විරෝධතාවයක් නැහැ. ඒ අයට විදේශගත වෙන්න අවස්ථාවක්. ඒ වාගේම තවත් කාරක සභා හතරක් පහක් තිබෙනවා. අපේ හැම අමාත්‍යාංශයකම උපදේශක කාරක සභා තිබෙනවා. එතකොට ගිණුම් කාරක සභාවට විතරක් මේ සභාවේ වෙනම වරප්‍රසාදයක් තිබෙනවාද විදේශගත වෙන්න? අනෙක් මන්ත්‍රීවරුන්ට යන්න බැහැයි කියලා තහනමක් දාද්දී.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඒක හරි. ඒක හරි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම අහන්නේ මන්ත්‍රීවරු 104 ක් සභාවේ ඉන්නවා. මේ වරප්‍රසාදය ඔබතුමා ඇතුළු ඇමැති මණ්ඩය, මන්ත්‍රීවරු සතුයි. විදේශ සංචාර යන්න බැහැයි කියලා කියනවා. චක්‍රලේඛය අනුව රාජකාරී කටයුත්තක් හැරුනාම. එතකොට අනෙක් උපදේශක කාරක සභාවලටත් මේ රටේ බලපාලා තිබෙන තත්ත්වයත් එක්ක එක්කෝ යන්න දෙන්න. එක්කෝ නැති කරන්න. නැත්නම් ඔක්කෝටම එක සමානව යන්න දෙන්න. සභාවේ සල්ලි. මේ පෞද්ගලික සල්ලි නොවෙයි නේ? පෞද්ගලික සල්ලිවලින් ඕනෑ විධියට යන්න පුළුවන්. අපට අවුලක් නැහැ. අපේ කාලයේ ඔක්කෝම 104 ම ඇරියානේ. 104 ම නොගිය නිසා තමයි අපි මේ අහන්නේ. එක කට්ටියකට යන්නයි, අනෙක් කට්ටියට නිකම් ඉන්නයි එහෙම අයිතියක් තියෙනවාද? එහෙම නීතියක් තියෙනවාද මේ චක්‍රලේඛවල.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒක අහන්න කෝ මෙරිල් මන්ත්‍රීතුමාගෙන්. කොහොමද ගියේ කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි මන්ත්‍රීතුමා, ඒ පිළිබඳව -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගිය අය ඉන්නේ, රෝස් ජෝර්ජ් මන්ත්‍රීතුමා ඉන්නේ අහන්න කෝ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අර කොඩිකාර මන්ත්‍රීතුමාගේ කථාව සම්පූර්ණයෙන්ම ඇත්ත.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කැගහන කට්ටියගෙන් අහන්න කෝ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ආණ්ඩුකාරතුමා කිව්වාලු පස් දෙනා ගණනේ යවන්න කියලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔය ඉන්නේ ජෝර්ජ් මන්ත්‍රීතුමාගෙන් අහන්න කෝ? ඉස්සෙල්ලාම ගියේ ඒගොල්ලෝ තමයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අද රටවත් යනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මම ගියේ නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතකොට එහෙම නම් අනෙක් ඇමැති මණ්ඩලයේ උපදේශක කාරක සභාවලටත් ඒ කරුණ අනුව පහ ගණනේ හරි යවන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අපි කියලා තිබෙන්නේ ගිණුම් කාරක සභාව වාගේම අනෙක් මන්ත්‍රීවරුත් පස් දෙනා, පස් දෙනා යවන්න කියලා. හැබැයි ඒ කාලේ කොඩිකාර මන්ත්‍රීතුමා අපව එක්කරගෙන ගියේ නැහැ. වෙනත් කට්ටිය එක්කරගෙන ගියේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මට ප්‍රශ්නයක් නැහැ. මට පෞද්ගලිකව වුණත් ගිය හැකි. මම ලොක්කා එක්ක රටවල් 80 කට විතර ගිය මිනිහා නේ? මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මාව එක්කරගෙන ගියා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නිදහස් උත්සවයටත් ගියේ -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපි ඉන්න කාලේ ගරු සභාපතිතුමනි, ප්‍රසන්න රණතුංග මහ ඇමැතිතුමා -

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මහ ඇමැතිතුමාට මහරගම ඔළුව උස්සන්නත් දුන්නේ නැහැ. මතක නම් හොඳයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපි සියලු උපදේශක කාරක සභාවල හිටපු මන්ත්‍රීවරු රට ඇරියා. විදේශ සංචාර -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ප්‍රශ්න යොමු කරන්න අදාළ නිලධාරීන්ට උත්තර දෙන්න කියලා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපි එක එක Training වලට, සංචාරවලට අපි වෙනම අංශවලට අපි ඇරියා. ප්‍රවාහනය දියුණු කර ගැනීම, සෞඛ්‍ය දියුණු කර ගැනීම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ ප්‍රශ්නය මොකක්ද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එහෙම නම් දැන් ගිණුම් හදන්න කාරක සභාවක් ලෝකයේ තිබෙනවාද, ලංකාව ගැන. ජනාධිපති උපදේශක නිසා තමයි මම ගියේ. ඒක වෙනම කථාවක්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒක වරප්‍රසාදයක්. යොමු කරන්න වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපි ඔක්කොම වෙනුවෙන් මම මේ කථා කරන්නේ.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

37(1) යටතේ අපෙත් වරප්‍රසාද උල්ලංඝණය වීමක් වෙලා තිබෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

37(1). වරප්‍රසාදය ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

එහෙම විශේෂ වරප්‍රසාද ලැබෙන්නේ කොහොමද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, මට නම් විදේශයන්ට යෑම ගැටළුවක් නොවෙයි. අපි මේ ලයිට් එකක් සවි කරන්න කිව්වා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සවි කරනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේක කියවා ගන්න බැරිව ගියා. ඉක්මණ් කරලා මේ සභාවේ කටයුතු සාර්ථක කරගන්න මේ ලයිට් එක එන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඉක්මණට සවි කරනවා. අපි සාම්පල් එකක් බැලුවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පොත්පත් කියවා ගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගෙනැල්ලා Test කළා. ඒක හදයි. අපි ඒක සවි කරන්නම්. කොඩිකාර ගරු මන්ත්‍රීතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය සම්බන්ධව අසාධාරණයක් තිබෙන බව මටත් පේනවා. ගරු මහ ඇමතිතුමාත් ඒක පිළිගන්නවා. ගරු මහ ඇමැතිතුමාත් ඒකට එකඟයි.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

පොදු එකක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොදු එකක්. ඒක තමයි. ඒ නිසා සභාවේ මතයක් මොකක් හරි ක්‍රියාත්මක කරලා අපි තීරණයකට එමු.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

උපදේශක කාරක සභා වාගේම මන්ත්‍රීවරු පස් දෙනා, පස් දෙනාත් යවන්න කියලා. ඒක කියලා තිබෙන්නේ.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ඉක්මන් කරන්න කියන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඉක්මන් කරන්න කියන්න.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ප්‍රධාන ලේකම්තුමාට කියන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම දෙයක් තවම නම් ඉතින් - ගිණුම් කාරක සභාව විතරයි ලැහැස්ති කරලා තිබෙන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

හරි. හරි. පුළුවන් ඉතින්. සභාපතිතුමා කරන්න කෝ. සභාපතිතුමාත් හොරෙන් යනවා මිසක් මන්ත්‍රීවරුන්ට යන්න දෙන්නේ නැහැ නේ. ඒක නේ කේස් එක වෙලා තිබෙන්නේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, මාස දෙකකට විතර කලින් හේමකුමාර නානායක්කාර ආණ්ඩුකාරතුමා සිටිද්දී අපේ ප්‍රවාහන අමාත්‍යාංශයට අදාළම උපදේශක කාරක සභාවම ගෙනැල්ලා කණ්ඩායමක් නියම කළා. මුල් පස් දෙනා මේ කණ්ඩායම. ඊළඟ පස් දෙනා මේ කණ්ඩායම කියලා එහෙම නම් කරලාත් යැව්වා, ජනාධිපති කාර්යාලයෙන් අනුමැතිය ගන්නවා කියලා. හැබැයි ඒ කටයුතු වුණේ නැහැ. අපිව වෙන වෙනම Interview කළා. මන්ත්‍රීවරුන්ගේ ඇප්ලිකේෂන් ඒකක් ගේන්න කිව්වා. මහත් තුට්ටුවට දාලා වැඩේ කළා. යන්න ඕනෑ නිසා ඒ වැඩේට කට්ටිය ලැහැස්ති වුණා. ඒත් කෙරුණේ නැහැ. ඇත්තටම එක කණ්ඩායමකට විතරක් කරන එක වැරැදියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒකයි අපේ තර්කය.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

එක එක්කෙනාට එක එක විධියට සලකන්නේ. කනගාටුයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මට පෞද්ගලිකව යන්න පුළුවන්. ඒක ප්‍රශ්නයක් නැහැ. මම හෙට අනිද්දාත් විපක්ෂ නායකතුමා එක්ක ඉන්දියාවට යනවා. ඒක වෙන දෙයක්.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

උපාලි කොඩිකාර හිටපු ඇමතිතුමාගේ කථාව හරි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒක සාධාරණයි.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

අපි ලබන මාසයේ අධ්‍යාපන අමාත්‍යාංශයෙනුත් යනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඔබතුමාත් ගිහිල්ලා තිබෙනවා නේ. ඔබතුමා තමයි ප්‍රධානියා. ඔබතුමා මේක විසඳන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කොඩිකාර ගරු මන්ත්‍රීතුමා මට එහෙම බලයක් නැහැ. විදේශ සංචාර සඳහා මන්ත්‍රීවරු තීන්දු කිරීම.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

නැහැ. නැහැ. මේකට වෙනම අයවැයක් තිබෙනවා නේ පිටුවක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක ආණ්ඩුකාරතුමාට තමයි සම්පූර්ණ බලය තිබෙන්නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපේ අයවැයෙන් වෙනම vote එකක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කොඩිකාර ගරු මන්ත්‍රීතුමා මට ඔබතුමාගේ ප්‍රශ්නය තේරෙනවා. දැන් මොරිස් විජේරත්න ගරු මන්ත්‍රීතුමාත් කථා කළා. ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමාත් කථා කළා. මෙතැන අසාධාරණයක් තිබෙනවා. මට ඒ ගැන තීරණයක් ගන්න බැහැ. ගරු ප්‍රධාන ඇමතිතුමාත් ඉන්නවා. ප්‍රධාන ලේකම්තුමාත් ඉන්නවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඔබතුමාට තීරණයක් ගන්න බැරි නම් සභා කටයුතු එකට දාලා, සභා කටයුතු එකේ අපේ ගරු මන්ත්‍රීවරුන් එක්ක කථා කරලා තීරණයක් අරගෙන, මහ ඇමතිතුමාගේ කැබිනට් මණ්ඩලයට කැබනට් පේපර් එකක් දාලා කැබිනට් එකේ එකඟතාවය අරගෙන ආණ්ඩුකාරතුමාට ළඟට අරින්න. ඒකයි කරන්න ඕනෑ. නැහැ, බැහැ කියලා ඔය පුටුවේ ඉඳලා වැඩක් නැහැ. ඔය පුටුව දීලා තිබෙන්නේ වැඩ කරන්න, සභාවට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කොඩිකාර ගරු මන්ත්‍රීතුමා, දැන් ඕක පැහැදිලියි. තවදුරටත් කථා කරලා තේරුමක් නැහැ. ප්‍රධාන ලේකම්තුමා පුළුවන් නම් මට මේ සම්බන්ධව වාර්තාවක් දෙන්න. මොකක්ද වෙන්නේ කියලා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඉතින් ප්‍රධාන ලේකම්තුමාත් ගිහිල්ලා නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇ..

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඇයි නැත්තේ? ඒ ගිය සංචාරය ප්‍රධාන ලේකම්තුමාත් ගිහිල්ලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. ඒ ගිණුම් කාරක සභාවෙන් නොවෙයි. වෙනම -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම දන්නේ නැහැ. පෞද්ගලිකවද මොකක්ද කියලා. මට ආරංචිය ආවේ ගිණුම් කාරක සභාවත් එක්ක ගියයි කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මට දෙන්න කෝ. ඇත්තටම ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ ප්‍රශ්නය ප්‍රධාන ලේකම්තුමාත් එක්ක කථා කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඉක්මණට -

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

සභාපතිතුමාත් ගිහිල්ලා තමයි ආවේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒක කරන්න. දැන් මෛත්‍රීපාල සිරිසේන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, දැන් වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා දැන් ඉන්නේ ඒකාබද්ධ විපක්ෂයේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ගොඩක් වෙලා ඒ ප්‍රශ්නය කථා කළා. ඔක්කොම මන්ත්‍රීවරු මට එකයි. මට වෙනසක් නැහැ. ඔක්කොම කට්ටිය අරිනවා නම් මමත් කැමැතියි. එහෙම යන්නේ නැහැ නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඔබතුමා අපේ යෝජනාව කාරක සභාවට දාන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපේ ඉල්ලීම මේ සතියේ තිබෙන කාරක සභාවට දාලා අපේ කැබිනට් එකට ඔබතුමා අරින්න. කැබිනට් එකේ යෝජනාව ස්ථිර කරගෙන ආණ්ඩුකාරතුමාට යවන්න. ආණ්ඩුකාරතුමා කිව්වාලු නේ. පස්දෙනා පස්දෙනා යවන්න පුළුවන් කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා ලේකම්තුමා, කොඩිකාර ගරු මන්ත්‍රීතුමා මේ සභාවේ කරපු ප්‍රකාශයත්, වරප්‍රසාද ප්‍රශ්නයත් -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මුළු සභාවටම දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි. මට පැහැදිලියි. දැන් ඔබතුමා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමා, මට ගැටලුවක් නැහැ. සාධාරණයක් තිබෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි, හරි ගරු මන්ත්‍රීතුමා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මන්ත්‍රීවරු 104 දෙනා වෙනුවෙන් මම සාධාරණයක් ඉල්ලන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා ලේකම්තුමා ඔබතුමා අදම මේ කොඩිකාර ගරු මන්ත්‍රීතුමා කරපු ප්‍රකාශයත් තිබෙනවා. මොරිස් විජේරත්න ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කළා. ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කළා මන්ත්‍රීවරුන්ගේ අයිතීන් පිළිබඳව. ඒ නිසා ඔබතුමා මේ ගැන ආණ්ඩුකාරතුමා දැනුවත් කරන්න. මෙන්න මේ වාගේ චාරිකාවලට මන්ත්‍රීවරු විරුද්ධයි. ඒ නිසා මේ ගැන අපට තීරණයක් දෙන්න කියලා. අපට වෙන කරන්න දෙයක් නැහැ. කොහොමද යන්නේ කියලා තීරණයක් කළා නේ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

දැන් ගරු සභාපතිතුමනි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි, හරි. දැන් මට තේරෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා කිව්වා ප්‍රවාහන අමාත්‍යාංශයේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි, හරි. අපි පොඩි ළමයි නෙවෙයි නේ අපට තේරුම් ගන්න පුළුවන්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එහෙම නම් හේමකුමාර නානායක්කාර මැතිතුමා මේ කරන විධිය ගැන කියලා මේකේ යෝජනාවක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පැහැදිලියි. ඔබතුමා ඉතින් උගන්වන්න දෙයක් නැහැ. අපට තේරෙනවා. දැන් සිංහලෙන් කිව්වා කරන්න ඕනෑ දේවල්. ලේකම්තුමා, කොඩිකාර ගරු මන්ත්‍රීතුමාගේ විරෝධය, මොරිස් විජේරත්න මැතිතුමාගේ විරෝධය සහ මෙතුමාගේ විරෝධය සඳහන් කරලා ගරු ආණ්ඩුකාරතුමාව

[ගරු සභාපතිතුමා]

වහාම දැනුවත් කරන්න. මේ වාගේ විරෝධතා සභා ගර්භය තුළ ඇති වුණා. ඒ නිසා ඉතිරි කාරක සභාවලටත් යන්න අවස්ථාව දෙන්න කියලා. අපි ඒවා තහනම් කරන්න කියන්නේ නැහැ. ඒවත් යන්න ඕනෑ. ඒ මන්ත්‍රීවරුත් යන්න ඕනෑ. අනෙක් කාරක සභාවල මන්ත්‍රීවරුන්ටත් ඒ අවස්ථාව දෙන්න ඕනෑ. ඒකයි සාධාරණය කියන්නේ. ඒ ගැන ඔබතුමා වහාම ආණ්ඩුකාරතුමා දැනුවත් කරන්න.

සභාවේ එකඟතාවය අනුව ඊළඟ සභා රැස්වීම අද දිනයෙන් පසුව 2019.02.21 වන බ්‍රහස්පතින්දා දින පැවැත්වෙන බව සභාවට දැනුම් දෙනවා.

පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු යටතේ පළමුවෙන්ම නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ඔබතුමාගේ යෝජනාව ඉදිරිපත් කිරීමට.

## පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු
PRIVATE MEMBER'S AFFAIRS

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, "*ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා දීම පෞද්ගලික අංශයේ ආයතන විසින්* -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු සභාපතිතුමනි, මම රීති අත්හිටුවීමේ යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක න්‍යාය පත්‍රයට ඇතුළත් වෙලා නැහැ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

න්‍යාය පත්‍රයට එන්නේ නැහැ නේ ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අද දවසේත් ඒක නැහැ. ඒක පරාජය වුණා නේ නේද? එදා ඒක පරාජය වුණා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මොකක්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පරාජය වුණාම ආපහු එන්නේ නැහැ. ඔබතුමාගේ යෝජනාව පරාජය වුණා නේ?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

නැහැ, නැහැ. ඒ යෝජනාව නොවෙයි. වෙනත් යෝජනාවක් ඉදිරිපත් කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කවද්ද දුන්නේ?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

දැන් ඔබතුමා අතට පත් කරලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කොයි වෙලාවේද දුන්නේ?

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

මේ Tabled කරලා තියෙනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඔබතුමාට ගෙනැල්ලා දුන්නා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කවුද ගෙනැල්ලා දුන්නේ?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ලේකම්තුමා හරහා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

මේ Tabled කරලා තියෙනවා සභාපතිතුමා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

රීති අත්හිටුවීමේ යෝජනාවලට වෙලාවක් තියෙනවා නේ? දැන් දෙන්න බැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතුමා හදිසියේ යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

දැන් ඕක ඔබතුමා අතට පත් කරලා විනාඩි 15 ක් 20 ක් වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තිබෙන කාර්ය බහුලත්වයත් එක්ක මට ඒක දැනුවත් වුණේ නැහැ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ලේකම්තුමා හරහා ඉදිරිපත් කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි එවන්න ඇති. මම ඒ ලිපිය කියවන්නම්.

සභා ලේකම්තුමා,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

කාර්ය පටිපාටි රීති අංක 110 යටතේ රීති අත්හිටුවීමේ යෝජනාවක් ඉදිරිපත් කිරීම.

2019.01.22 වන දින පළාත් සභා රැස්වීමේදී සාකච්ඡා කිරීම පිණිස කාර්ය පටිපාටි රීති අංක 110 යටතේ පහත යෝජනාව ඉදිරිපත් කරමි.

*"පොදු වැදගත්කමකින් යුක්ත වූද, කාලීන වූද පහත සඳහන් යෝජනාව සභාවට ගෙන ඒම සඳහා කාර්ය පටිපාටි රීති 14(6), 14(7)(ආ), 19(1), 19(3), 39, 53(2), 53(3) යන රීති අත්හිටුවිය යුතු බවට යොජනා කර සිටිමි."*

*යෝජනාව :*

*"සත්‍ය හෝ යථාර්තය නොදැන මිත්‍යාවන්ගේ ගිලී සිටීම මෙන්ම ඒවා දැන දැනම ඒවායේ ගැලී සිටීම අතර ද වෙනසක් ඇත්තේ ය. වර්තමානයේ අප රටේ මිනිසුන් ධනය, බලය, වාසනාව, නිරෝගීකම මෙන්ම ග්‍රහදෝෂ, වාස්තු දෝෂ, භූමි දෝෂ සේම රැකියා ජයග්‍රහණ, පවුලේ දියුණුව, දේශපාලනයේ ඉහළට යාම, ජයග්‍රහණයන් ලබා ගැනීමට, සතුරන් මැඩලීමට, අධ්‍යාපන ජයග්‍රහණත්, වාසනාවන්ත විවාහ ආදී මෙකී නොකී හිතූ පැතූ සම්පත් ලබා දෙන බව කියන සොරුන්, තක්කඩින්, බොරුකාරයින් මෙන්ම මිත්‍යා විශ්වාස පතුරවන්නන් අප සමාජය ග්‍රහණයට ගෙන ඇත. මෙම ජාවාරම්කාරයින් ජනමාධ්‍ය ද උපයෝගී කරගෙන මිත්‍යාව වපුරවමින් ඇත.*

*21 වන සියවසේ නවීන තාක්ෂණයේ විද්‍යාවේ දියුණුවේ හිනි පෙත්තටම යන මෙවන් යුගයක මෙවැනි මිත්‍යාවන් වපුරන්නටත්, ඒවාට මාධ්‍ය ප්‍රචාර ලබා දීම පාලනය කිරීමටත්, මෙම බොරුකාරයින්ට එරෙහිව නීති සම්පාදනය කර අවශ්‍ය අණපනත් ගෙන එමින් මිත්‍යාවන්ගෙන් අප සමාජය මුදා ගැනීමට අවශ්‍ය ක්‍රමවේදයන් සම්පාදනය කරන මෙන් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයෙන් ඉල්ලා සිටී."*

නිශාන්ත ශ්‍රී වර්ණසිංහ,
බස්නාහිර පළාත් සභා මන්ත්‍රී.

මේක තමයි එතුමා ඉදිරිපත් කරලා තිබෙනව රීති අත්හිටුවීමේ යෝජනාව. මේ යෝජනාව සම්බන්ධයෙන් -



**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, ඔය වාගේ යෝජනාවක් න්‍යාය පත්‍රයෙන් ගේන්න. මොකද, එතකොට කථා කරන්න කරුණු හොයාගෙන එන්න එපැයි. වාස්තු දෝෂ, තොවිල් ඒවායේ කරුණු තියෙනවා. එතකොට මේකට කථා කරන්න ඒවා සොයා ගන්න ඕනෑ. ඒ නිසා මේක න්‍යාය පත්‍රය හරහා එවන්න.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, එතුමාගේ යෝජනාව අපි අහගෙන හිටියා. ඒක ටිකක් ගැඹුරින් සාකච්ඡා කළ යුතු දෙයක් නිසා අපට අවස්ථාවක් ලැබුණොත් හොඳයි. එක පාරටම ඒ පිළිබඳව අදහස් දක්වන්නට යැමේදී ටිකක් ගැටළුවක් එනවා. ඒක නිසා මේක අද නොගෙන වෙනත් දිනයක් -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව ගිය සභාවට ආපු අවස්ථාවේදී ඒ යෝජනාවේ අන්තර්ගතය සම්බන්ධ ප්‍රශ්නයක් මතු වෙලා නොවෙයි ඒ යෝජනවා පැරද්දුවේ. ඒ වෙලාවේ ඡන්දය විමසුවේ රීති අත්හිටුවීමට. ඒ රීති අත්හිටුවීම නිසා තමයි ඒ යෝජනාව ආවේ නැත්තේ. ඒ ඡන්ද විමසීමට යන්න හේතුව තමයි නියෝජ්‍ය සභාපතිතුමාගේ යෝජනාවක් තිබෙනවා. ඒක ඒ වෙලාවේ ඊට වැඩිය වැදගත්. ඒක ගන්න ඕනෑ කියලා තමයි ඡන්දයකට ගියේ. ඒ නිසා යෝජනාව සම්බන්ධ ප්‍රශ්නයක් නොවෙයි. මේ සභාවට රීති අත්හිටුවලා යෝජනා එනවා. ඇත්තටම මේ වාගේ යෝජනාවකට අමුතුවෙන් ලැහැස්ති වෙන්න දෙයක් නැහැ. මම හිතන්නේ මහජන නියෝජිතයෝ හැටියට. මේ යෝජනාවේ අන්තර්ගතය සම්බන්ධව ඕනෑම මහජන නියෝජිතයෙක් දන්නවා. ඒ නිසා අපි විශ්වාස කරන්නේ රීති අත්හිටුවලා ඒ යෝජනාව එන නිසා දැන් ඒ යෝජනාව සාකච්ඡාවට ගන්න ඕනෑ කියලා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, මේ වාගේ යෝජනා ගණනාවක් තිබෙනවා න්‍යාය පුස්තකයේ ඇවිල්ලා න්‍යාය පත්‍රයේ. එතකොට මේ වාගේ යෝජනාවක් කල් ඇතුව දැනුම් දීලා කරන්න පුළුවන්කම තිබෙනවා. මම දන්නේ නැහැ මේකේ තිබෙන හදිසිය, ඉක්මන්කම. එතකොට අත්‍යවශ්‍යම එකක් ගන්න තිබෙන හැකියාව මොකක්ද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. අපට මේ යෝජනාවට විරුද්ධත්වයක් නැහැ. අපි මේ යෝජනාව පිළිබඳව ඇත්තටම දන්නෙත් නැහැ. නමුත් මේ කාරණාව පැහැදිලි වෙන්නේ මේ වෙලාවේ අත්‍යවශ්‍ය හදිසි - මේ රීති අත්හිටුවීමට අදාළ කරුණු ගත්තාම තිබෙන්නේ අත්‍යවශ්‍ය, හදිසි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා මෙහෙමයි. මේ රීති අත්හිටුවීමේ යෝජනාව ගිය පාරත් ගෙනාවා. කොහොම හරි එදා රීති අත්හිටුවීමේ යෝජනාව පරාජය වුණා. නමුත් යෝජනාව පරාජය වුණේ නැහැ නේ? මෙතැන යෝජනාව තිබුණා. ඒ නිසා මට එතැන ගැටළුක් තිබෙනවා. රීති අත්හිටුවීමයි ඡන්දයෙන් පැරදුණේ. නමුත් යෝජනාව අයින් කර ගැනීමේ තීරණයක් සභාවේ ගත්තේ නැහැ. සභාපතිවරයා වශයෙන් මට එතැන පොඩි ගැටළුවක් තිබෙනවා. ඒ නිසා රීති අනුව අපට මේක ගන්න සිද්ධ වෙනවා. අපි සභාවේ කැමැත්ත බලමු. අපි සභාවේ කැමැත්ත ගමු. ඉස්සෙල්ලා මේ රීති අත්හිටුවීමේ යෝජනාවට කැමැති අය ඉන්නවා නම්, අපි එහෙම යන්න ඕනෑ. ඉස්සෙල්ලා ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, මම දන්න විධියට ඔබතුමා තමයි තීන්දු කරන්න ඕනෑ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ සභානායකතුමා සමාවෙන්න. පොඩ්ඩක් ඉන්න කෝ?

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

එතුමාට කථා කරන්න දුන්නා නම් ඇයි මට කථා කරන්න දෙන්නේ නැත්තේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට අවස්ථාව දුන්නා නේ?

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මටත් අදහසක් ප්‍රකාශ කරන්න දෙන්න. ඔබතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට එහෙම අදහස් ප්‍රකාශ කරන්න දෙන්න බැහැ.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

මෙතැන අදහස් ප්‍රකාශ කරන්න නීතියක් නැහැ. න්‍යාය පත්‍රයේ -

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ඇයි එහෙම නම් ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමාට දුන්නේ. එතුමාට දුන්නේ ඇයි? ඇයි මට ඒ අයිතිය නැත්තේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙන්න පුළුවන්. මම ඒ ගැන කියන්න යන්නේ නැහැ. ඔබතුමන්ලා -

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

නැහැ මම කියන්නේ, ඔබතුමා සභාපතිවරයා හැටියට මේකේ තීන්දු කරන්න කියලා අපි යෝජනා කරනවා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

දැන් ඔබතුමා ඡන්දයකට කථා කළේ. ඉන් පස්සේ ආයෙත් කථා කරන්න බැහැ නේ?

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ඔබතුමා නේ මූලාසනේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න කෝ?

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

දෙවිධියකට සලකන්න එපා සභාපතිතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙවිධියකට නොවෙයි. මම කියන්න යන්නේ නැහැ. ඔබතුමා සභානායකතුමා නේ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

රීති පොත අනුව රීති අත්හිටුවලා යෝජනාවක් ගේන නිසා නේ රීති අත්හිටුවීම පරාජය වුණේ. එතකොට මේක අනුව රීති අත්හිටුවීම තිබෙනවා. රීති අත්හිටුවීම අනුව යෝජනාව පරාජය වුණාම මේ වගන්ති ටික - ඒ යෝජනාව අයිත් ගේන්න බැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

යෝජනාව පරාජය කළේ නැහැ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු සභාපතිතුමනි, රීති අත්හිටුවීමේ යෝජනාව විතරයි -

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ඔබතුමා ඒ වෙලාවේ හිටියෙත් නැහැ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

පරාජය කළේ. එහෙම නැතුව යෝජනාව පරාජයට පත් කළේ නැහැ. යෝජනාව පරාජයට පත් කරලා එහෙම නම් රීති අත්හිටුවීම -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

යෝජනවා, රීති අත්හිටුවන්න -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

රීති අත්හිටුවන්න ගෙනාවෙත් ඒ යෝජනාව. ඒකයි පැරැද්දුවේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

රීතියේ වගන්ති ටික අත්හිටුවන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මේ යෝජනාවට බය ඇයි?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

රීතිවල වගන්ති ටික අත්හිටුවලා -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔය යෝජනාවට බයක් නැහැ. ඔය යෝජනාව අපට අදාළත් නැහැ. වැඩක් නැහැ. මේකේ තිබෙන සාමාන්‍ය සම්ප්‍රදායට අනුව යන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඔබතුමාගේ යෝජනාවක් න්‍යාය පත්‍රයේ නැහැ. නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවක් තිබෙන්නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මන්ත්‍රීවරු රීති අත්හිටුවීමේ යෝජනාව පරාජය කළා. පරාජය කළාට පස්සේ නැතුව රීති අත්හිටුවලා ඒ යෝජනාව ගේන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න. ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න. ඉස්සෙල්ලා රීති අත්හිටුවීමේ යෝජනාව ගේන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු සභාපතිතුමනි, කාර්ය පටිපාටි රීති අංක 110 යටතේ රීති අත්හිටුවීමේ යෝජනාවක් ඉදිරිපත් කිරීම. 2019.02.05 වන දින පළාත් සභා රැස්වීමේදී සාකච්ඡා කිරීම පිණිස කාර්ය පටිපාටි රීති අංක 110 යටතේ පහත යෝජනාව ඉදිරිපත් කරමි.

*"පොදු වැදගත්කමකින් යුක්ත වූද, කාලීන වූද පහත සඳහන් යෝජනාව සභාවට ගෙන ඒම සඳහා කාර්ය පටිපාටි රීති 14(6), 14(7)(ආ), 19(1), 19(3), 39, 53(2), 53(3) යන රීති අත්හිටුවිය යුතු බවට යොජනා කර සිටිමි."*

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

යෝජනාවත් ඉදිරිපත් කරන්නද?

*"සත්‍ය හෝ යථාර්ථය නොදැන මිත්‍යාවන්ගේ ගිලී සිටීම මෙන්ම දැන දැනම ඒවායේ ගැලී සිටීම අතරද වෙනසක් ඇත්තේය. වර්තමානයේ අප රටේ මිනිසුන් ධනය, බලය, වාසනාව, නිරෝගීකම මෙන්ම ග්‍රහ දෝෂ, වස්තු දෝෂ, භූමි දෝෂ සේම රැකියා ජයග්‍රහණ, පවුලේ දියුණුව, දේශපාලනයේ ඉහළට යාම, ජයග්‍රහණයන් ලබා ගැනීමට, සතුරන් මැඩලීමට අධ්‍යාපන ජයග්‍රහණත්, වාසනාවන්ත විවාහ ආදී මෙකී නොකී සිතු පැතූ සම්පත් ලබා දෙන බව කියන සොරුන්, තක්කඩින්, බොරුකාරයින් මෙන්ම මිත්‍යා විශ්වාස පතුරුවන්නන් අප සමාජය ග්‍රහණයට ගෙන ඇත. මෙම ජාවාරම්කාරයින් ජනමාධ්‍ය ද උපයෝගී කර ගෙන මිත්‍යාව වපුරවමින් ඇත. 21 වන සියවසේ නවීන තාක්ෂණයේ විද්‍යාවේ දියුණුවේ හිනි පෙත්තටම යන මෙවන් යුගයක මෙවැනි මිත්‍යාවන් වපුරන්නටත්, ඒවාට මාධ්‍ය ප්‍රචාර ලබා දීම පාලනය කිරීමටත් මෙම බොරුකාරයින්ට එරෙහිව නීති සම්පාදනය කර අවශ්‍ය අණ පනත් ගෙන එමින් මිත්‍යාවන්ගෙන් අප සමාජය මුදා ගැනීමට අවශ්‍ය ක්‍රමවේදයන් සම්පාදනය කරන මෙන් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයෙන් ඉල්ලා සිටී."*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා රීති අංක 110 යටතේ රීති අත්හිටුවීම යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ එක්කම එතුමා යෝජනාවත් ඉදිරිපත් කළා. ඒ යෝජනාවට සභාවේ එකඟතාවය මට දෙන්න.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව එකඟයි. ඒ සම්බන්ධව ප්‍රශ්නයක් නැහැ. ගැටළුවක් නැහැ. සභාව එකඟයි. ප්‍රශ්නයක් නැහැ නේ?

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

අපි විරුද්ධයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නම් කවුද යෝජනාව ස්ථිර කරන්නේ.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

***[විසින් ස්ථිර කරන ලදී.]***
*[Seconded]*

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු සභාපතිතුමනි, මේ යෝජනාවක් අපට Tabel එකටවත් නැහැ. මොකක්ද මේ විහිළුවක් නේ කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි එවන්නම් දැන්.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

විහිළු කරන්නේ මේ සභාව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතැන මූලාසනයේ ඉඳගෙන මම සාධාරණය ඉෂ්ට කරන්න ඕනෑ. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු දැන ගන්න ඕනෑ සභාවට වේලාසන එන්න. උදේ මෙතැන කවුරුවත් නැහැ. ඇමතිවරුත් නැහැ. ප්‍රශ්නවලට උත්තර දෙන්න. අනික් ඒවාට මන්ත්‍රීවරු නැහැ. මන්ත්‍රීවරු උදේ එන්න ඕනෑ. ඒක මන්ත්‍රීවරුන්ගේ වගකීමක්.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

අපි හිටියා. උදෙත් හිටියා. දැනුත් ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා දැන් යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

යෝජනාව නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමන්ලා සභාවේ ඉන්න එපැයි. ඉන්නේ නැහැ නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගේන්නේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගෙනාවා. අපි copy ගහලා එවන්නම් දැන්.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු සභාපතිතුමනි, පසුගිය මාසයේ මේ රටේ විශාල ආන්දෝලනයකට තුඩු දුන්, ඒ වාගේම මාධ්‍යවල ප්‍රධාන සිරස්තල බවට පත් වෙලා තිබුණු කාරණාවක් තමයි මේ රටේ පාර්ලිමේන්තුව පිහිටා තිබෙන මේ ජයවර්ධනපුර නගරයේ, ආසන්නයේම තිබෙන මධ්‍යස්ථානයක පවත්වාගෙන යනු ලබන සම්පූර්ණයෙන්ම ජනතාව මිත්‍යාවට ගෙන යන, ඒ වාගේම ජනතාව තුළ මිත්‍යාව වපුරන ආයතනයක් පිළිබඳව විශාල ආන්දෝලනයක් ඇති වීම. ඒක සියලුම මාධ්‍යවල පළ වුණා. මොකක්ද මේ ආයතනය. නමෝ නාරායන මධ්‍යස්ථානය කියලා කෝට්ටේ ප්‍රදේශයේ පවත්වාගෙන යන සුවිසල් මන්දිරයක් තුළ කර ගෙන යනු ලබන මේ ව්‍යාපාරය පිළිබඳව රටේ ඉමහත් ආන්දෝලනයක් ඇති වුණා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, දැන් මම විරුද්ධයි කියලා ඔබතුමාට කිව්වා. ඔබතුමා ඒ විරෝධය පිළිගන්නේ නැද්ද?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඔබතුමා කිව්වේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විරෝධය මොකක්ද ඔබතුමාගේ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ගරු සභාපතිතුමනි, අපි විරුද්ධයි කියලා කිව්වා. ඇයි ඒක පිළිගන්නේ නැත්තේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔබතුමා ඇහුවා මේකට පක්ෂද කියලා. මම කිව්වා නැහැ විරුද්ධයි කියලා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

අපි විරුද්ධයි කියලා කිව්වාම සභාව පිළිගන්නේ නැත්තේ ඇයි?

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මම තනියෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ගාමිණී තිලකසිරි අමාත්‍යතුමා මට අවශ්‍ය උපදෙස් දුන්නා මේකට එකඟයි කියලා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

අපි විරුද්ධයි කියලා කිව්වා නේ?

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, මොකක්ද මේකේ වැදගත්කම. වැඩක් නැති යෝජනාවක් නේ මේ පළාත් සභාවට ගෙනැල්ලා තිබෙන්නේ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

සභාවේ කාලය කැමක් තිබෙන්නේ. තව මාස දෙකයි සභාව තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඒක වෙනම ප්‍රශ්නයක්. යෝජනාව ඉදිරිපත් කළාට පස්සේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා තීරණය කළා ඒකට -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මේ කොළඹ දිස්ත්‍රික්කයේ -

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මීට වඩා වැදගත් දේවල් කථා කරන්න තිබෙනවා. මොනවාද මේවා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

තමුන්නාන්සේ තීන්දු ගන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මම පුද්ගලයෙක් විධියට කිව්වා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මිත්‍යාව වපුරවන්න -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

නැහැ. මම පුද්ගලයෙකු විධියට කිව්වා නේ? මම විරුද්ධයි කියලා කිව්වා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එකඟතාවය ඇහුවා. ඇහුවාම ගරු ප්‍රධාන අමාත්‍යතුමායි, ගාමිණී තිලකසිරි අමාත්‍යතුමායි කිව්වා ඒකට එකඟයි කියලා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

නැහැ. විරුද්ධයි කියලා කිව්වේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, මම විරුද්ධයි කියලා කිව්වා නේ? මම කිව්වා විරුද්ධයි කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නම් ඉතින් කථා කරන්න. මහ ඇමතිතුමා එක්ක කථා කරන්න ඉතින්. මහ ඇමතිතුමාගේ එකඟතාවයට විරුද්ධව නේ ඔබතුමන්ලා කථා කරන්නේ දැන් මේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මම කිව්වා, මම විරුද්ධයි කියලා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, දැන් මේ බබාලාද? දැන් ඔබතුමා යෝජනාව කියෙව්වා. ඉස්සෙල්ලා කියෙව්වා මෙතුමා. ඔබතුමන්ලා කොහේද ඉන්නේ?

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

කිව්වාට පස්සේ විරුද්ධයි කිව්වේ. ඔබතුමන්ලාගේ කන් ඇහෙන්නේ නැද්ද දන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

යෝජනාවට පස්සේ ඒකට විරුද්ධ නම් විරුද්ධයි කියලා ප්‍රකාශ කරන්න ඕනෑ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

කිව්වා. සිංහලෙන් කිව්වා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

බබාලාද?

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔබතුමා බබා වෙන්න එපා. සිංහලෙන් කිව්වා.



**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

බබාලාද? මේ සභාවේ වැඩ කරන්න තේරෙන්නේ නැද්ද?

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඇසුයි කනුයි දෙකම ඇහෙන්නේ පේන්නේ නැද්ද? සිංහලෙන් කිව්වා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. ඔබතුමා කථා කරන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒක තමයි අපි කථා කළේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඉතින් අපි විරුද්ධයි කිව්වා නේ?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඇයි මේකේ කාලීන වැදගත්කමක් නැද්ද? නැහැ නේද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔය ඔක්කොම සාස්තර අහන කට්ටිය කැ ගහන්නේ. සාස්තරකාරයෝ ටික. මිරිස් කුඩු ගහන අය.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

කැවා නම් වමාරපන් මචං.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මන්ත්‍රීවරුන්ගේ යෝජනා තිබුණා නේ? ඒ යෝජනා තිබෙද්දී මේක ගත්තේ. හදිසි එකක් කියලා. මම ඒකට විරුද්ධයි කියලා කිව්වා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩු පක්ෂයේ නායකතුමා ගරු ප්‍රධාන අමාත්‍යතුමා තමයි සභාවේදී මට කිව්වා එතුමා එකඟයි කියලා. යෝජනාව ගේන්න කියලා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

එතකොට අපිට විරුද්ධත්වය ප්‍රකාශ කරන්න බැරිද? ආණ්ඩු පක්ෂයේ. මහ ඇමතිතුමා කිව්වාම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම මහ ඇමතිතුමාගෙන් ඇහුවේ. ගාමිණී ඇමතිතුමාත් හිටියා. දෙන්නාම එකඟයි කිව්වා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මහ ඇමතිතුමා මොකක් කිව්වත්, මම කිව්වා මම විරුද්ධයි කියලා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මට අවස්ථාව ලබා දෙන්න. මගේ වෙලාව.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මම කිව්වා, මම විරුද්ධයි කියලා. මහ ඇමතිතුමා මොකක් කිව්වාද කියලා මම දන්නේ නැහැ. මහ ඇමතිතුමා කියන සමහර ඒවාට අපි විරුද්ධයි. පසුගිය කාලයේත් එහෙම විරුද්ධ වුණා.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු සභාපතිතුමනි, ඡන්දය විමසමු.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මහ ඇමතිතුමා කියන ඒවාට අපි විරුද්ධ නොවී සිටියේ නැහැ. සමහර ඒවාට ඉතිහාසයේත්. පසුගිය කාලේ. අදත් අපි විරුද්ධයි.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

අපි කිව්වාද නැද්ද කියලා මේ වීඩියෝ එකෙන් පෙන්වන්න. එතකොට අපි බලන්නම් විරුද්ධ වුණු එක. චෙක් කරන්න මේක. අපි විරුද්ධයි කියලා ප්‍රකාශ කළා. වීඩියෝ එක චෙක් කරන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අපි විරුද්ධයි කියලා කිව්වා ගරු සභාපතිතුමනි.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, මේ න්‍යාය පත්‍රයේ -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

යෝජනාව පරාජය කළේ නැහැ. ගරු සභාපතිතුමනි, එකඟතාවය ලැබිලා තිබෙන්නේ මේ -

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

අපි මෙතැන නැගිටලා කිව්වා. ප්‍රකාශ කළා. විරුද්ධයි. එකඟ නැහැයි කියලා කිව්වා. කරුණාකරලා චෙක් කරන්න.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

අපට මේ මිත්‍යාව වැදගත් නැහැ. ගරු සභාපතිතුමනි, නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරලා තිබෙන යෝජනාව මීට වැඩිය ගොඩක් වැදගත් යෝජනාවක්. ඒ යෝජනාව සාකච්ඡාවට ගන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කඩාකප්පල් කට්ටිය.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා ඒකට කැමැත්ත ප්‍රකාශ කරලා තිබෙනවා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මොකක්ද මේ කරන විහිළුව.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

නිරෝෂන් මන්ත්‍රීතුමාගේ අකමැත්තක් නැහැ, මේ යෝජනාවට.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

නිරෝෂන් මන්ත්‍රීතුමාගේ අකමැත්තක් නැහැ නොවෙයි. ඒක තමයි වැදගත් යෝජනාව. මේක මොකක්ද මේ? කොහේවත් යන මේ කාට කාට හරි අමාරු ඇති. අපි විරුද්ධයි. අපි බලන්නේ නැහැ මේක. මුළු රටටම බලපාන යෝජනාවක් මීට වැඩිය -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

කාටද මේ අමාරුව කියලා තමයි අහන්න තිබෙන්නේ දැන්.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

අපේ න්‍යාය පත්‍රය තිබෙනවා. දැනුයි මේ යෝජනාව අපට හම්බ වුණේ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

කවුද මේ බෙලි කටුකාරයෝ ආරක්ෂා කරන්න ඉදිරිපත් වෙන්නේ? වාලම්පුරිකාරයෝ, බෙලි කටුකාරයෝ, ආරක්ෂා කරන්නද ඔබතුමා ඉදිරිපත් වෙන්නේ?

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

අපි වාලම්පුරිකාරයෝ දන්නේ නැහැ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඒක දැන ගන්න ඉතින්. ඔබතුමා බබෙක් නොවෙයි නේ? මේ යෝජනාව ඉදිරිපත් කළා. ඔබතුමන්ලා මේ -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පාර්ලිමේන්තුවේ මිරිස් කුඩු ගැහුවෝ සාස්තර අහලාද දන්නේ නැහැ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ඔබතුමන්ලා සභාවේ වෙලාව අරගෙන මේ ගැන රටේ මතයක් හදලා දෙන්න හදනවා මෙතැන. බොරු වැඩ කරන්න එපා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මේක වැදගත් දෙයක් කථා කරන්න තිබෙන වෙලාව. න්‍යාය පත්‍රයට සාමාන්‍ය විධියට එනවා නම් එන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

කෝට්ටේ නගරයේ වෙන සිද්ධියක් ගැන දන්නේ නැද්ද?

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

සාධාරණයක් තිබෙන්න ඕනෑ. මොකක්ද මේ? වාලම්පුරියක් දැන්නේ නැහැ. හක්ගෙඩියක් දන්නේ නැහැ. මෙලෝ දෙයක් දන්නේ නැහැ. මේ රටේ මිනිස්සුන්ගෙන් භාගයක්ම දන්නෙත් නැහැ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඔබතුමා ඔක්කොම දන්නවා. මේක විතරයි දන්නේ නැත්තේ. අනික් ඔක්කොම දන්නවා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මෙන්න යෝජනාව. ක්ෂුද්‍ර මූල්‍ය ආයතන කපා හරින්න. ඒක කථා කරන්න. මේ එලක් නැති දෙයක් ගැන කථා කරන්නේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔව්. මිනිස්සුන්ගේ ප්‍රශ්න ගැන කථා කරන්න.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මිනිස්සු අමාරුවේ වැටිලා ඉන්නේ මේවා හින්දා. ඒ ගැන කථා කරන්න. මේ එලක් නැති දේවල් ගැන කථා කරන්නේ නැතිව.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඔය කාගේ හඬද කියලා පේනවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු මන්ත්‍රීතුමා, අපට ඔබතුමාගේ යෝජනාව පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. මේ වෙලාවේ මේක සුදුසු ද නැද්ද කියන කාරණය -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

හරි ඉතින්. මේ යෝජනාව දැන් මේ සභාවේ -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මේක අත්‍යවශ්‍ය, හදිසි යෝජනාවක් නොවෙයි කියලයි අපි කියන්නේ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඉතින් ප්‍රශ්නයක් නොවෙයි නම් වාඩි වෙන්නකෝ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔබතුමා වෙන වෙලාවක යෝජනාවක් ගේන්න. සාමාන්‍ය න්‍යාය පත්‍රයට දාලා ගේන්න. අපි ලැහැස්ති වෙලා අවේ න්‍යාය පත්‍රයේ තිබෙන යෝජනාවට.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව තිබෙන්නේ. එතුමා මේ යෝජනාවට කැමැත්ත පළ කරලා තිබෙනවා. රීති අත්හිටුවලා ගේන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ගන්නේ නැත්නම් ඊළඟ යෝජනාව ගන්න ඕනෑ. ඊළඟ යෝජනාව.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඔබතුමාට මොකක්ද තිබෙන අමාරුව. රුදාව මොකක්ද?

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අපි විරුද්ධයි කිව්වා නම් විරුද්ධයි.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

කවුද?

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අයිතිවාසිකම් නේ? මන්ත්‍රීවරයෙකුගේ අයිතිවාසිකම. සභාපතිතුමා මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් රකින්න ඉන්නවා නම් ඇයි අපි විරුද්ධයි කිව්වාට පස්සේ ඒක නොසලකා ඉන්නේ ඇයි?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් මේක අහන්න කෝ? ආණ්ඩු පක්ෂයේ කණ්ඩායම් නායකයා, ප්‍රධානියා ගරු ප්‍රධාන අමාත්‍යතුමා. එතුමා කිව්වා මේ යෝජනාව ගන්න එකඟයි කියලා. ඉතින් ඔබතුමන්ලා දැන් විරුද්ධ වෙන එක තේරුමක් නැහැ නේ?

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

එතුමා කිව්වා වුණාට අපි විරුද්ධ වුණා. එතුමායි අපියි විරුද්ධ වෙන ඒවා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමායි, ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමායි එකඟ වුණා. විවාදයට ගන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

එතුමායි අපියි විරුද්ධ වෙන ඒවා ඉතිහාසයේත් තිබ්බා. අදත් තිබෙනවා. හෙටත් තියෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇයි දැන් එහෙම කථා කරන්නේ. මෙතැන ප්‍රශ්නයක් වෙනවා නේ?

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

නැහැ. අපි පක්ෂ නැහැයි කිව්වා නේ? අපි එකඟ නැහැයි කිව්වා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ මනුස්සයාට නඩුවක් තිබෙනවා දැන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තේරුම් ගන්න මන්ත්‍රීතුමා. තේරම් ගන්න කෝ? එතුමා යෝජනාව ඉදිරිපත් කළා. මම ඇහුවා, සභාවේ ඒ ගැන බෙදීමක් තිබෙනවාද?

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඒ කියන කොට මම කිව්වා බෙදීමක් තිබෙනවා කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කණ්ඩායමේ නායකයා ගරු ප්‍රධාන අමාත්‍යතුමා නේ? ඔක්කෝගෙන්ම අහන්නේ නැහැ නේ ඒක. විපක්ෂයෙන් අහන්නේ විපක්ෂ නායකතුමා හරි සංවිධායකතුමාගෙන් හරි.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

එතුමා කියන සමහර ඒවාට අපි විරුද්ධ වෙලා තිබෙනවා, ඉතිහාසයේ. එතකොට කණ්ඩායම් නායකයා විධියට සමහර වෙලාවේදී -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා තමයි ඒකට එකඟ වුණේ. ගාමිණී ඇමතිතුමායි.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මහින්ද, ඔයාගේ යෝජනාව ඊට වඩා වැදගත්. එහෙම නම් බලන කොට.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ යෝජනාව තමයි අපි ගේන්න කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ඔබතුමන්ලා කථා කරලා තේරුමක් නැහැ නේ දැන් මේක.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඕගොල්ලෝ කියන්නකෝ. ඕගොල්ලන්ගේ නායකයාට. එයා මාරු වෙනවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මන්ත්‍රීවරයෙකුගේ අයිතිවාසිකම නේ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඔයා මාරු වෙන්න එපා. කියන්න ඕගොල්ලන්ගේ නායකයාට. ඔයාගේ යෝජනාව ගේන්න කියලා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, න්‍යාය පත්‍රයේ වැදගත් යෝජනා දෙකක් තිබෙද්දී මේ පළක් නැති යෝජනා නේ ඉදිරිපත් කරලා තිබෙන්නේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අපි ආවේ මහින්දගේ යෝජනාවට කථා කරන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

න්‍යාය පත්‍රයට ගේන්න ඕනෑ නැහැ. ඒකටනේ රීති අත්හිටුවීම් තිබෙන්නේ. රීති අත්හිටුවීම් කියලා එකක් තිබෙනවා නේ? න්‍යාය පත්‍රයම එන්න ඕනෑ නැහැ නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අනුමත වෙලා තිබෙන්නේ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

අනුමත වෙලානේ තිබෙන්නේ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මේ විකාරයක් නේ මේ යෝජනාව.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මහ ඇමතිතුමාගේ විරුද්ධත්වයක් නැත්නම් මොකක්ද තිබෙන ප්‍රශ්නය.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මහ ඇමතිතුමා කියන ඔක්කොම අපි කරන්නේ නැහැ. මහ ඇමතිතුමා ඉස්සරහාම කියන්නේ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඒක මහ ඇමතිතුමාත් එක්ක විසඳගන්න. මාත් එක්ක කථා කරලා වැඩක් නැහැ. කණ්ඩායමේ -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මෙතැන ඔබතුමායි සභාපති. ඔබතුමායි තීරණ ගන්නේ මේ රීති පොත අනුව.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

එතකොට මගේ මන්ත්‍රී ධූරයට තිබෙන අයිතිය.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

මම හිටියේ කණ්ඩායමත් එක්ක.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මහ ඇමතිතුමා, කණ්ඩායමේදී ඔබතුමා අපෙන් වෙනම ඇහුවේ නැහැ නේ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

කණ්ඩායමේ නායකයා මිසක් සභාවේ නායකයා නොවෙයි. මෙතැන ඉන්නවා සභානායක. මේ සභාවේ ඉන්නවානේ සභානායක කෙනෙක්. මහ ඇමතිතුමා කැබිනට් එකේ නායකයා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමාවෙන්න. මෙම ගරු සභාව විනාඩි 10 කට කල් තබනවා.

*ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. **11.13** ට යළිත් රැස් විය.*

*Sitting, accordingly suspened untill 11.13 a.m. and then resumed.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා රීති අංක 110 යටතේ රීති අත්හිටුවීමේ යෝජනාවක් ඉදිරිපත් කළා. ස්ථිර කළා. ඒ නිසා මම තීරණය කළා එම යෝජනාව සාකච්ඡාවට ගන්න. ඔබතුමාට ආරාධනා කරනවා, යෝජනාව ඉදිරිපත් කරන ලෙස. ඔබතුමා ඉස්සෙල්ලා යෝජනාව කියෙව්වාද?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

එක වරක් කියෙව්වා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නයක් තිබෙනවා, ගණපූරණය පිළිබඳව.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒකනේ කලින් අපි ඇහුවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න. දැන් ගණපූරණය නැහැ නේ? කරුණාකරලා සීනුව නාද කරන්න.

[සභාවේ සෝෂා]

තව පාරක් සීනුව නාද කරන්න. කරුණාකරලා, තව සැරයක් සීනුව නාද කරන්න. මට බැහැලා ගිහිල්ලා ආයිත් එන්න බැහැ. දුර වැඩියි මේකේ. මීටර් 500 ක් විතර පයින් එන්න ඕනෑ.

[සභාවේ සෝෂා]

මෙම සභා ගර්භයේ තවමත් ගණපූරණය සම්පූර්ණ වෙලා නැහැ. මම තව විනාඩි 05 ක් බලනවා.

[සභාවේ සෝෂා]

# කල් තැබීම
# ADJOURNMENT

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ ගණපූරණය නොමැති නිසා 16(1) රීතිය යටතේ මම මෙම සභාව කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව පූ.භා. 11.22 ට, 2019 පෙබරවාරි මස 21 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

*Accordingly, the Provincial Council was adjourned at 11.22 a.m till 09.30 a.m, on 21.02.2019.*